අපගේ

# දැක්ම

"පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තය සඳහා
ජාත්‍යන්තරව පිළිගනු ලබන
පුහුණුව සහ තාක්ෂණික සේවා
වෘත්තිය මට්ටමින් සහ ඒකාග්‍රතාවයකින් යුතු
සේවා සපයන්නෙකු බවට පත්වීම."

අපගේ

# මෙහෙවර

"පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ
ධරණීය සංවර්ධනයට පහසුකම් සැපයීමෙන්
තත්වය සහ ඵලදායිතාවය වඩාත් දියුණුකර
ගැනිම සඳහා විශ්වාසවන්තනීය වූ විශේෂඥයින්
සහ තාක්ෂණික සේවාවන් සැපයීම."


පරික්ෂණ කටයුතු
පුහුණු කිරිම
තාක්ෂණ සේවා
උපදේශන සේවා
අපගේ සේවාවන්

# සංයුක්ත තොරතුරු

| | | |
|---|---|---|
| **ආයතනයේ නම** | : | ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය |
| **ලිපිනය** | : | කඳවල වත්තල අංක 02<br>සර් ජෝන් කොතලාවල මාවත<br>රත්මලාන |
| **ලියාපදිංචිය** | : | 2009 අංක 12 දරණ පනත |
| **නෛතික භාවය** | : | ව්‍යවස්ථාපිත මණ්ඩල |
| **අමාත්‍යාංශය** | : | කර්මාන්ත සහ වාණිජ |
| **පාලක මණ්ඩලය** | : | • එම්.ඒ. තාජුඩීන් මහතා (සභාපති)<br>• රෝයි ජයසිංහ මහතා (අනුශාසක)<br>• ආචාර්ය යූ.එස්.ඩබ්. ගුණසේකර මහතා<br>• ආචාර්ය එම්.ඊ.ආර්. පෙරේරා මහතා<br>• ඊ.ඒ.එන්.එස්. පෙරේරා මහතා<br>• ටී.වී.ඩී.සී.එස්. කරුණාරත්න මිය<br>• ඩබ්.එන්. නිමාලි ඩී. සිල්වා මිය<br>• ෆිලික්ස් ඒ. ප්‍රනාන්දු මහතා<br>• ඩබ්..ඩී.යූ. සිල්වා මහතා<br>• ආර්.එම්. ජයන්ති මිය<br>• හර්ෂ විජේවර්ධන මහතා<br>• කේ.එච්. බන්දුල ප්‍රනාන්දු මහතා<br>• ජෆාර් සතාර් මහතා |
| **විගණක** | : | රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| **දුරකථන අංක** | : | 2632406/2622858/2636917 |
| **ෆැක්ස් අංක** | : | 2636337/2622897 |
| **ඊ මේල්** | : | director@textile-clothing.lk |
| **බ්වෙබ් අඩවිය** | : | www.slita.lk |

# පටුන


| | |
|---|---|
| ආයතනය පිළිබඳ සමාලෝචනය | 1-3 |
| ක්‍රියාකාරකම් දැක්වෙන විශේෂ අවස්ථා | 4 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | 5-6 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 7-8 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ වගකීම පිළබඳ ප්‍රකාශය | 9 |
| ගිණුම් ප්‍රතිපත්ති | 10-13 |
| පොදු හෙළිදරව් කිරීම් | 13-15 |
| මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව | 16 |
| ආදායම් ප්‍රකාශන වාර්තාව | 17 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 18-19 |
| ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය | 20 |
| මූල්‍යමය ප්‍රකාශන සටහන් | 21-34 |
| ක්‍රියාකාරකම් දැක්වෙන දර්ශක | 35 |
| මූල්‍ය ප්‍රකාශන වාර්තාව | 36-38 |
| 2017 වසරේ ක්‍රියාකාරකම් | 39-42 |
| 2018 වසර සඳහා අනාගත සැලසුම් | 43 |
| විගණකාධිපති වාර්තාව | 44-57 |

# ආයතනය පිළිබඳ සමාලෝචනය

## හැඳින්වීම

රෙදිපිළි සහ ඇඟලුම් ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි සුවිශේෂී දායකත්වයක් දරණ අතර තරඟකාරී මිලගණන්වලට උසස් තත්වයෙන් යුතු නිෂ්පාදනයන් රටේ කර්මාන්ත අංශයට සැපයීම සඳහා ඊට තිබෙන ශක්තිමත් හැකියාව පිළිබඳව අභිමානයෙන් ද යුතු වේ. ඉහළ ගුණාත්මක බවකින් යුතු සිය සේවානියුක්තයන්, සමගින් අපනයන ඉලක්කයන් සහිතව ජාත්‍යන්තර වෙළඳපොළෙහි තරඟකාරී තත්වයට පත්වීම එහි අරමුණයි. දේශීය මෙන්ම විදේශීය බොහෝ සමාගම් කර්මාන්තයේ අවශ්‍යතාවයන් සඳහා වූ ඔවුන්ගේ නිෂ්පාදන පහසුකම් ස්ථාපනය කර තිබෙන අතර කර්මාන්තයේ, අළුත් අවශ්‍යතාවයන් සපුරාලීමේ අභියෝගය භාරගැනීමට කර්මාන්තයේ පුරෝගාමී සේවා සපයන්නෙකු වශයෙන් ශ්‍රී ලංකා රෙදිපිළි සහ ඇඟලුම් ආයතනය සූදානමින් සිටී.

මෙම ක්ෂේත්‍රයේ පුහුණු කිරීම්, තත්ව පරීක්ෂා කිරීම් සහ අදාල සේවාවන් පිළිබඳ විශේෂඥතාවය ආයතනය විසින් උපදේශන මාර්ගයෙන් ලබාදෙන අතරම එහි නවතම කාර්යයන් වශයෙන් පහත දැක්වෙන ක්ෂේත්‍රයන් ඉලක්ක කරගනිමින් වඩාත් නම්‍යශිලි ලෙස සේවාවන් සැලසීමට කටයුතු කරයි.

- රෙදිපිළි සහ ඇඟලුම් ක්ෂේත්‍රයේ කල්පවතින සංවර්ධනය සහ අධ්‍යයන සේවාවන් ඇති කිරීම.
- සිදුවෙමින් තිබෙන තාක්ෂණික සංවර්ධනයන් පිළිබඳව කර්මාන්ත ක්ෂේත්‍රයේ දැනුම කළමනාකරණ හැකියාවන් වර්ධනය කිරීම.
- රෙදිපිළි සහ අඟලුම් නිෂ්පාදනයේ යෙදී සිටින දේශීය සහ විදේශීය පුද්ගලයන් වෙත තාක්ෂණික සහ උපදේශන සේවාවන් සැලසීම.
- දේශීය අත්යන්ත්‍ර කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා විශේෂඥ ඥාණය ලබාදීම.
- ඇඟලුම් අත්යන්ත්‍ර රෙදිපිළි සහ පාවහන් කුඩා පරිමාණයෙන් නිෂ්පාදනය කිරීමේ යෙදී සිටින ග්‍රාමීය ප්‍රජාවට තාක්ෂණික සහාය සැලසීම.
- උපාධි පාඨමාලාවන් ලබාදීම සඳහා විදේශීය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය මත පදනම්ව වඩාත් යහපත් පාරිභෝගික තෘප්තියක් සහිතව සේවා සැපයුම් වෙත ප්‍රවේශ වීම.
- තාක්ෂණික ක්ෂේත්‍රයෙහි පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හි නිරතවීම.

රටේ නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි නියැලී සිටින සේවක ප්‍රජාවගෙන් බහුතර පිරිසකට රෙදිපිළි සහ ඇඟලුම් ක්ෂේත්‍රයෙහි මේ වනවිට රැකියා අවස්ථා සපයයි. රෙදිපිළි සහ ඇඟලුම් ක්ෂේත්‍රයෙහි මානව සම්පත් ප්‍රාග්ධනය තවදුරටත් වර්ධනය කරනු පිණිස තමන් ඉදිරියේ පවතින අභියෝගයන් වඩාත් ප්‍රශස්ථ ලෙස භාරගැනීම සඳහා ශ්‍රී ලංකා රෙදිපිළි සහ ඇඟලුම් ආයතනය රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි සහයෝගීත්වය සමගින් කටයුතු කරමින් සිටී.

## පාලක මණ්ඩලය

ආයතනයේ ප්‍රතිපත්ති හා නිතිරීති සම්බන්ධයෙන් තිරණ ගැනීමේ බලය පාලක මණ්ඩලය වෙත පැවරී ඇති අතර එම තිරණ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාමත්මක කරනු ලැබේ.

පාලක මණ්ඩල රැස්වීම සෑම මසකම පැවැත්වෙන අතර ප්‍රගති ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීමත් ආයතනයේ මෙහෙයුම් කටයුතු සම්පාදනය කිරීමත් මෙහිදි සිදු කෙරේ.

## 2017.12.31 වන දිනට පාලක මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| එම්.ඒ තාජුඩීන් මහතා | සභාපති | අතිරේක ලේකම් | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| රෝයි ජයසිංහ මහතා | අනුශාසක | | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| ඩබ්.එන්. නිමාලි ඩී. සිල්වා මිය | සාමාජික | | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය |
| කේ.එච්. බන්දුල ප්‍රනාන්දු මහතා | සාමාජික | | ඒකාබද්ධ ඇඟලුම් සංසදය |
| ෆිලික්ස් ඒ ප්‍රනාන්දු මහතා | සාමාජික | | ශ්‍රී ලංකා ඇඟලුම් අපනයන කරුවන්ගේ සංගමය |
| ටී.වී.ඩී.සී.එස්. කරුණාරත්න මිය | සාමාජික | | සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය |
| ජෆාර් සතාර් මහතා | සාමාජික | | ශ්‍රී ලංකා ඇඟලුම් අපනයන කරුවන්ගේ සංගමය |
| ආර්.එම්. ජයන්ති මිය | සාමාජික | | මුදල් හා සැලසුම් අමාත්‍යාංශය |
| ආචාර්ය යූ.එස්.ඩබ්. ගුණසේකර මහතා | සාමාජික | | මොරටුව විශ්ව විද්‍යාලය |
| ආචාර්ය එම්.ඊ.ආර්. පෙරේරා මහතා | සාමාජික | | විවෘත විශ්ව විද්‍යාලය |
| ඊ.ඒ.එන්.එස්. පෙරේරා මහතා | නිරීක්ෂක | | |
| ඩබ්.ඩී.යූ. සිල්වා | සාමාජික | | පේෂකර්ම නිශ්පාදන සංගමය |
| හර්ෂ විජේවර්ධන මහතා | සාමාජික | | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| එම්.පී. කන්නන්ගර මහතා | මණ්ඩලයේ ලේකම් | | |

## 2016.12.31 දිනට කාර්ය මණ්ඩලය

සම්පූර්ණ කාර්ය මණ්ඩල සංඛ්‍යාව 104 කි.

## කාර්ය මණ්ඩලයේ රාජකාරි බෙදී යන ආකාරය

| වර්ගය | කළමනාරකණ හා මෙහෙයුම් | තාක්ෂණික මෙහෙයුම් | මූල්‍ය | පොදු පරිපාලන |
|---|---|---|---|---|
| සේවක | 06 | 52 | 04 | 36 |
| තාවකාලික/පුහුණු | නැත | නැත | නැත | නැත |
| ගිවිසුම්ගත/පැවරුම් | නැත | 06 | නැත | නැත |

ඒ. රොබට් වී. පීරිස් මහතා - අධ්‍යක්ෂ ජනරාල් MBA(UK), B.Sc(Eng)Hons, PG DIP IE, AMIE(SL),MIAE(UK),MA-DEV.Studies&Public Policy MCPM (SL)

එස් ඉලංගෝවන් මහතා - අධ්‍යක්ෂ (පුහුණු සහ කාර්මික)
B.Sc. (Eng) (Text), MBA, AMIE (SL)

පී.වී.එස්. විජේරත්න මහතා - අධ්‍යක්ෂ (මෙහෙයුම්)
M.Sc (MIT), M.Sc (Mgt), B.Tech (Eng) Hons
AMIE (SL), LLB

එම්.පී. කන්නන්ගර මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)
MBA (P.I.M.), B.Sc (Col),
PG Dip in International Relations (BCIS),
Dip in American Prof. Qualification (HRM)
LLB (UG), Dip in Legal Studies

වයි.ඒ.පී.ජී. යාපා මහත්මිය - ගණකාධිකාරි
B.Com (Spe), CBA

යූ.එම්. ප්‍රබෝෂිනී මහත්මිය - අභ්‍යන්තර විගණක
B.BA (Spe), CBA

## ජ්‍යෙෂ්ඨ නිළධාරී මණ්ඩලය (තාක්ෂණ)

ජී.කේ.කේ.එස්. කුමාර මහතා - ජ්‍යෙෂ්ඨ තාක්ෂණඥ, B.Sc. Eng.(Text), MBA,AMIE(SL)

බී.එල්.එස්.පී. නිශාන්ත මයා - ජ්‍යෙෂ්ඨ තාක්ෂණඥ, B.Sc. (Hons), M.Sc (Text)

ජේ.පී. සමරකෝන් මහතා - ජ්‍යෙෂ්ඨ තාක්ෂණඥ, NDT (Mech.)

කේ.ඒ.ආර්.වී. අබේවර්ධන මිය - ජ්‍යෙෂ්ඨ තාක්ෂණඥ, NDT (Tex. Tech.)

කේ. ජෙගදිසන් මහතා - ජ්‍යෙෂ්ඨ තාක්ෂණඥ, B.Sc. (Eng) (Text)
M.Sc. (Text), AMIE (SL)

# ක්‍රියාකාරකම් දැක්වෙන විශේෂ අවස්ථා

## 1. මූල්‍ය ක්‍රියාකාරකම්







## 2. භෞතික ක්‍රියාකාරකම්






## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා ජේෂකර්ම සහ ඇඟලුම් ආයතනය, එහි පූර්ව ආයතන ද්විත්වය ඒකාබද්ධ කරමින් පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාපිත ආයතනයක් වශයෙන් විධිමත්ව පිහිටුවන ලද්දේ වඩා යහපත් ප්‍රතිඵල ලබාගැනීමටයි. එතැන් පටන් ගතවූ වසර කිහිපය මුළුල්ලේ කර්මාන්තයෙහි ප්‍රධාන ව්‍යාපාරික කාර්යයන් සපුරාලිමේ ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා ජේෂකර්ම සහ ඇඟලුම් ආයතනය සිය දියුණුවේ ගමන්මගෙහි ඉදිරියට යමින් සිටී. තම අවසන් ඉලක්ක කරා යන ගමනේ දී ආයතනයට බොහෝ අභියෝගයන්ට මුහුණදීමට තිබේ. එසේකුදු වුවත් පූර්ව ආයතන ද්විත්වය ඒකාබද්ධ වීමේදී දීර්ඝකාලීනව අත්කරගත් අත්දැකීම් තුළින් අත්කරගත් දක්ෂතා සහ ශක්‍යතා සහිතව මේ සියලුම අභියෝගයන්ට නොබියව මුහුණදීමට හැකි ශක්තිය ආයතනය සතුව පවතී.

අප ආයතනය ප්‍රමුඛ වශයෙන් අධ්‍යාපනික ආයතනයක් වන අතර කර්මාන්තයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි එහි ප්‍රධාන ව්‍යාපාරික අංශයන් සම්බන්ධ පෘථුල දැනුමින් සන්නද්ධ වූ ඉහළ සුදුසුකම්ලත් ආචාර්ය මණ්ඩලයක් එය සතුය. කර්මාන්තයේ අපේක්ෂාවන්ට ගැලපෙන පරිදි එම ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය සියලු උත්සාහයන්හි ආයතනය නිරතව සිටී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජේෂකර්ම සහ ඇඟලුම් විශ්ව විද්‍යාලය වශයෙන් උපාධි ප්‍රදානය කිරීමේ තත්වයට පත්වීමේ අඩිතාලම අප එක් අතකින් දමා තිබේ. වැඩිමනක් වශයෙන්, බොහෝ ශිෂ්‍ය පිරිසකට මෙම ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපන අවස්ථාවන් සඳහා දොරටු විවර කිරීමේ අරමුණින් යුතුව අග්නිදිග ආසියානු කලාපයේ උසස් අධ්‍යාපන ආයතන සමගින් සහයෝගිව කටයුතු කිරීමේ හැකියාවන් පිළිබඳව ගවේශනය කෙරෙමින් පවතී.

ඒ අතරම, මෙම අංශයෙන් සාර්ථක ව්‍යාපාර ආරම්භ කිරීමට අපේක්ෂා කරන තරුණ ප්‍රජාවටත් තම කර්මාන්තය වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරන, කර්මාන්තයේ නියුක්තයන්ටත් ඔවුන්ගේ කර්මාන්ත ව්‍යාපාර තත්වයන් වර්ධනය කරගැනීමට අවශ්‍ය පුහුණුව ලබාදීමට ආයතනය විසින් මංපෙත් විවරකර තිබේ. ශ්‍රී ලාංකිකයන් පමණක් නොව පාකිස්ථානය, ඉන්දියාව සහ බංගලාදේශය ආදි රටවලින් පැමිණෙන සිසුන් ද ආයතනයේ පාඨමාලාවන් හදාරමින් සිටින අතර අසල්වැසි රටවල්හි ද නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා සේවාවන් පුළුල් කිරීමට ලැබීම ආයතනයේ ඉතිහාසයෙහි විශිෂ්ඨත්වයේ සලකුණක් වේ.

පරීක්ෂණ, පුහුණු කිරීම් සහ උපදේශන සේවාවන් මගින් පසුගිය වසරේ උපයාගත් ආදායම් සමඟ සසඳන කල සමාලෝචිත වසරේ දී පරීක්ෂණාගාරය උපයන ලද ආදායම 2% කින් ද පුහුණු කිරීම් ආදායම 27% කින්ද ඉහළ ගොස් තිබෙන අතර උපදේශන සේවාවන් මගින් උත්පාදනය කළ ආදායම පසුගිය වසරේ ලද ආදායමට සාපේක්ෂ වශයෙන් සමාන තත්වයක් විය. මේ අතර සමාලෝචිත වර්ෂය තුළ ආයතනය මගින් උත්පාදනය කළ සමස්ථ ආදායම පසුගිය වර්ෂයට වඩා 22% ක වර්ධනයක් අත්කරගෙන තිබේ. පුහුණු පාඨමාලා මෙන්ම විෂයමාලාවන් ද කර්මාන්තයේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි වසර තුළ දී සංශෝධනය කළ අතරම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි නවීන පහසුකම් සලසමින් පරීක්ෂණාගාරයට අවශ්‍ය කරන යටිතල පහසුකම් ද මෙම වසර තුළ දී සපයන ලදි.

කර්මාන්ත සහ වාණිජ අමාත්‍යාංශය මෙන්ම ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් ද දක්වන ලද සහයෝගය මම අගය කරමි. මෙරට පුරෝගාමී ආයතනයක් වශයෙන් විශිෂ්ඨත්වයට පත්වීම සඳහා වෙහෙස නොබලා කරන ලද කාර්යභාරයත් දිරිගැන්වීම පිළිබඳව සභාපතිතුමාටත් පාලක මණ්ඩලයටත් මාගේ බලවත් ස්තූතිය පිරිනමමි. අවසන් වශයෙන් ආයතනයේ සේවානියුක්තයන්ගේ කාර්යශූරත්වයත්, කැපවීමත්, මෙහිලා සටහන් තැබීමට මා අපේක්ෂා කරන අතර ඒ සියල්ල අතරින් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය විශ්ෂ්ඨත්වය කරා තවදුරටත් ගමන් කරනු ඇතැයි මම දැඩිව විශ්වාස කරමි.

ස්තූතියි.

ඉංජිනේරු රොබට් වී පිරිස්
අධ්‍යක්ෂ ජනරාල්

## සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තය මෙරටට විදේශ විනිමය උපයාදීම සඳහාවන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම කාර්යභාරයක් ඉටු කරයි. 2020 වසර වනවිට ඇමරිකානු ඩොලර් බිලියන 6 ක විදේශ විනිමය ආදායමක් ඉලක්ක කරගනිමින් අපනයන ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉහළ ශක්‍යතාවයක් සහිත මෙම කර්මාන්තය පිළිබඳව රජයේ අවධානය යොමුවී තිබෙන අතර රටේ අවශ්‍යතාවය අනුව ඉදිරියට ගමන් කරමින් සිටී. එම තත්වය මත, ජාත්‍යන්තර වෙළඳපලෙහි පවතින ගෝලීය තරගකාරීත්වයට සාර්ථකව මුහුණදීම අරබයා ජාත්‍යන්තර ප්‍රමිතියට සහ සැපයුමට ගැලපෙන පරිදි කටයුතු කිරීමට අභියෝග රැසකට මෙම කර්මාන්තය මුහුණ දී සිටී. ඒ අතරම ඇඟලුම් අපනයනයෙන් ලැබෙන ආදායම GSP+ තත්වය වර්ධනය වීමත් ගෝලීය වෙළඳපල තත්වයන්ට අවශ්‍ය කෙරෙන ප්‍රමිතීන්ට අනුගතවීමත් හේතුවෙන් ඇඟලුම් කර්මාන්තය තුළින් ලැබෙන අපනයන ආදායම රටේ සමස්ථ විදේශ විනිමය ආදායමෙන් විශාල කොටසක් උපයාදීමට සමත්ව තිබේ. මෙම තත්වයට පත්වීම වෙනුවෙන් සේවක පිරිසගෙන් ලැබෙන දායකත්වය සුළුපටු නොවන අතරම පුහුණු ශ්‍රමිකයන් සඳහා විශාල ලෙස පැතිරුණු රැකියා අවස්ථාවන් ද මෙම කර්මාන්තය තුළ ඇතිවී තිබේ. රටේ තරුණ ප්‍රජාවට රැකියා අවස්ථා සපයාදීමේ රජයේ ප්‍රතිපත්තිය සමඟ මෙම තත්වය අනුගතවන බව අපගේ විශ්වාසයයි.

පසුගිය දශක කිහිපය මුළුල්ලේම මෙම ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම පුහුණු ආයතනය වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය කර්මාන්තයේ අවශ්‍යතාවයන් සඳහා සේවා සපයන අතරම තරඟකාරී වෙළඳපලකට අවශ්‍ය කෙරෙන ඉහළ ප්‍රමිතීන් සැපයිය හැකි අයුරින් පූර්ණ ශක්තිය සහිත වෘත්තිමය කාර්ය මණ්ඩලයක් ද ආයතනය සතුය. ශ්‍රමිකයන් පුහුණු කිරීමේ සිට උපදේශන සේවාවන් සැපයීම දක්වා වූ පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ අවශ්‍යතාවයන් සඳහා වූ පුළුල් පරාසයක අපගේ සේවාවන් ව්‍යාප්තව පවතී. නිපුණ සහ පුහුණු ශ්‍රමිකයන් කර්මාන්තයට සැපයීමේ තම දායකත්වය සඳහන් කිරීමට අප ආයතනය ආඩම්බර වන අතරම තම ශිෂ්‍යයන් සඳහා නවීන පුහුණුවීමේ උපකරණ හඳුන්වාදීම මගින් එම තත්වය තවදුරටත් ශක්තිමත්වී තිබේ. අළුතින් බිහිවන වෙළඳපල සඳහා ගෝලීය වශයෙන් පවතින බරපතල තරඟකාරීත්වයට ගැලපෙන පරිදි ඉදිරියේදී මතුවන අභියෝගයන්ට මුහුණදීමට ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය මේ වනවිට සැදී පැහැදී සිටී.

සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 170 ක මෙහෙයුම් ආදායමක් ආයතනය වාර්තා කළ අතර පසුගිය වසර සමඟ සසඳන කල එය 22% ක වර්ධනයකි. මෙම ආදායමෙන් 26.47% ක් පරීක්ෂණ සේවාවන් වෙතින් උත්පාදනය වූ අතර මෙම කාලය තුළ අධ්‍යයන පාඨමාලා 237 ක් වෙනුවෙන් සහභාගී වූ පුහුණුවන්නන් 4048 කගෙන් උපයාගත් ආදායම මුළු ආදායමෙන් 53.5% ක් විය. කර්මාන්තයේ අළුත් සහ නවීන අංශයන් පිළිබඳව වූ ක්‍රියාමාර්ගයන් ගැනීමට ආයතනය සැලසුම් කරන අතර ඉන් ප්‍රධාන කරුණු වන්නේ රෙදිපිළි නිපදවීම සඳහා කෙසෙල් කෙඳි නූල් නිපදවා භාවිතා කිරීම, ඇඟලුම් නිපැයුම් ස්වයංක්‍රියකරණය සඳහා රොබෝටික් උපක්‍රම යෙදවීම, ළමා ඇඳුම්වල සෞඛ්‍ය සහ ආරක්ෂණ ප්‍රමිතීන් පිළිපැදීම සහ සම් ආශ්‍රිත නිශ්පාදනයන්හි ප්‍රමිතිය

වර්ධනය කිරීම ආදියයි. වැඩිමනත් වශයෙන්, පේෂකර්ම සහ ඇඟලුම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨතම ආයතනය බවට පත්වීම සඳහා වූ අපගේ අපේක්ෂාව වන්නේ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක තත්වයට පත්වීමට උත්සාහ කිරීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආයතනයේ ප්‍රවර්ධනයට පියනගන මාවතේ ප්‍රගමනය සඳහා වූ පූර්ණ සූදානමින් යුතුව, කර්මාන්තය විසින් ඉදිරිපත් කෙරෙන අභියෝගයන් සහ ඉල්ලුමට මුහුණදීමට අවශ්‍ය කෙරෙන ශක්‍යතාවයන් සහ හැකියාවන් ආයතනය තුල ප්‍රවර්ධනය කිරීමට පියවර ගනිමින් සිටිමු.

ගෝලිය වෙළඳපලෙහි නිරන්තරව වර්ධනයවන තරඟකාරිත්වයක් සහිත වූ මෙම කර්මාන්තයෙහි අවශ්‍යතාවයන් සපුරාලීමේ ශක්‍යතාවයෙන් මෙන්ම ශක්තියෙන් ද අප ආයතනය සන්නද්ධ වන බවට වූ බලවත් විශ්වාසය එහි ප්‍රමුඛතමයා වශයෙන් සභාපති වන මාහට තිබෙන අතර ගරු කර්මාන්ත අමාත්‍ය රිෂාඩ් බදුර්දීන් මහතා ඇතුළු අමාත්‍යාංශයේ සමස්ථ කාර්ය මණ්ඩලයටත් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ සමස්ථ කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වන අතර ඔවුන්ගේ බලවත් සහයෝගය ඉතා ඉහළින් අගය කරන බව ප්‍රකාශ කරමි.

ස්තුතියි.

එම්.ඒ. තාජුඩීන්
සභාපති
ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ වගකීම පිළබඳ ප්‍රකාශය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වූ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම විගණකවරුන්ගේ වගකීමෙන් වෙනස් වේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මූල්‍ය වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් ලැබෙන ප්‍රතිඵලය සමාගම් පනතට අනුව සත්‍ය වූත් සාධාරණ වූත් තොරතුරු පදනම් කරගෙන පිළියෙල කලයුතු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සඳහන් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නියමිත ගිණුම් ප්‍රතිපත්ති අනුව සත්‍ය වූත් සාධාරණ වූත් විනිශ්චයක් ලබාදීම සඳහා අදාල කරගත යුතු ගිණුම් ප්‍රමිතීන් අනුගමනය කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විශ්වාසයයි.

ආයතනයේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමටත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට ප්‍රමාණවත් සම්පත් ආයතනය සතුව ඇති බවටත් අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ විශ්වාසයයිග සමාගම් පනතට අනුකූලව ප්‍රමාණවත් ගිණුම් වාර්තාවන් පවත්වාගෙන යන බවත් සත්‍ය සහ සාධාරණත්වයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති බවටත් අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහතික වේ.

එමෙන්ම ආයතනය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා අදාල සාධාරණ පියවර ගැනීම සහ අනෙකුත් අක්‍රමිකතා හා වංචා වැළැක්වීම සඳහා ආයතනයට යෝග්‍යවන පරිදි අභ්‍යන්තර පාලක පද්ධතියක් ඇති කිරීමද අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වගකීම වේ.

මෙම ප්‍රකාශයේ සඳහන් තම වගකීම් මැනවින් ඉටු කර ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විශ්වාසය පළ කරයිග තවද අධ්‍යක්ෂ ජනරාල්වරයා තම දැනුම අනුව ශේෂපත්‍ර දිනට ආයතනයේ සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් සඳහා අදාලවන මූල්‍ය ප්‍රතිපාදන සලසා ඇති බවත් තහවුරු කරයි.

# ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී අදාල කර ගන්නා ලද ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි වේ.

**1. පිළියෙල කිරීමේ පදනම**

(i) මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා පොදු ගණකාධිකරණ මූලධර්ම (SLPSAS) අදාල කරගෙන ඇති අතර උපචිත පදනම මත ගිණුම් වාර්තා පිළියෙල කර ඇති අතර අදාල කාල පරිච්ඡේදය පුරාම මූලික ගිණුම් ප්‍රතිපත්ති අදාල කරගෙන ඇත.

(ii) කැලැන්ඩර් වසර ආයතනයේ මූල්‍ය වසර වේ.

(iii) ආයතනයේ ගිණුම් සහ මූල්‍ය පාලනය සඳහා 1971 අංක 38 දරණ මූල්‍ය පණත අදාල කරගනු ලැබේ.

**ගිණුම් ප්‍රතිපත්ති**

**1. දේපළ පිරියත සහ උපකරණ**

ඉඩම් හැර සියලුම යටිතල පහසුකම්, දේපළ පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැය/ගණනය කල මිලෙන් සමුච්චිත ක්ෂය අඩු කර දක්වා ඇත.

වත්කම් පිරිවැය ගණනය කිරීමේදී වත්කමේ අපේක්ෂිත භාවිතය සඳහා සුදුසු තත්වයට ගෙන ඒම වෙනුවෙන් දරණ ලද සියලුම වියදම් පිරිවැයට එකතු කර ඇත. වත්කමේ ප්‍රයෝජනයට ගතහැකි ජීවිත කාලය දීර්ඝ කිරීම සහ නැවත පියවා ගත හැකි වත්කමේ වටිනාකම වැඩි කළ හැකි හඳුනාගත් ප්‍රතිසංස්කරණයන් ප්‍රාග්ධනිත කර ඇත. අළුත්වැඩියා, නඩත්තු සහ සුළු අළුත් කිරීම් ආදායමට හර කර ඇත.

ඉවත් කරනු (අපහරණය) ලබන සියලුම යටිතල පහසුකම්, දේපළ, පිරියත හා උපකරණ වල පිරිවැය සහ ඒවාට අදාල සමුච්චිත ක්ෂය ප්‍රමාණයන් ශේෂපත්‍රයෙන් ඉවත් කරනු ලැබේ.

ස්ථාවර වත්කම් ඉවත් කිරීමේදී ඒවායේ ධාරණ අගය මගින් නිශ්චය කර ගත් ලාභය හෝ පාඩුව මෙහෙයුම් ලාභය නිශ්චය කිරීමේදී ගණනය කෙරේ.

2. **ක්ෂය කිරීම**

සෑම දේපළ පිරියත සහ උපකරණයකම පිරිවැය ලියා හැරීම සඳහා ඇස්තමේන්තු කල ප්‍රයෝජනයට ගන්නා ජීවිත කාලය තුල ඒ හා සමාන උපකරණයන් සඳහා සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් පරිදි ක්ෂය වෙන්කිරීම ගණනය කර ඇත.

**ක්ෂයවීම් සඳහා පහත සඳහන් ප්‍රතිශත අදාල කරගෙන ඇත.**

| | |
|---|---|
| ගොඩනැඟිලි | 2.5% |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 10% |
| ලී බඩු සවිකිරීම් සහ උපකරණ | 10% |
| ආපනශාලා උපකරණ | 10% |
| මෝටර් රථවාහන | 10% |
| පරිගණක සහ මෘදුකාංග | 20% |
| පොත් සහ සඟරා | 10% |
| රසායනාගාර උපකරණ | 10% |
| වීඩියෝ වැඩසටහන් | 25% |
| කර්මාන්තශාලා මහන මැෂින් | 10% |

වර්ෂයේ පළමු අර්ධයේ මිලදී ගන්නා වත්කම් සඳහා සම්පූර්ණ ක්ෂයවීම් ගණනය කරන අතර වර්ෂයේ දෙවැනි අර්ධයේ මිලදී ගන්නා වත්කම් සඳහා 50% ක ක්ෂයවීම් ගණනය කරනු ලැබේ.

3. **තොග**

ආයතනය සේවා සැපයීමේදී ප්‍රයෝජනයට ගන්නා ලද පිරිවැය අඩුම සහ උපලබ්ධි වටිනාකම අනුව දක්වා ඇති තොග මෙයින් හැඳින්වේ. තොග පිරිවැය නිශ්චය කර ඇත්තේ ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමයට වේ. (එෆ්.අයි.එෆ්.ඕ.)

4. **වෙළඳ ලැබිය යුතු**

ඉන්වොයිසිවල මුල්පිටපත්වල වටිනාකම අනුව සියලුම ලැබිය යුතු දෑ ගණනය කර ඇත.

5. **මුදල් සහ මුදලට සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය අනුව එහි අඩංගු වන මුදල් සහ මුදලට සමාන දෑ යනු අත ඉතිරි මුදල්ල තැන්පතු සහ මාස 3 ක් හෝ ඊට අඩු කාලයක් ඇතුලත කල් පිරෙන කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ඒවායි.

6. **වෙන් කිරීම්**

අතීත සිද්ධීන් වල ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ ඇතිවන්නා වූ නෛතික හෝ ගොඩනැඟෙන්නා වූ බැඳියාවන් නිරවුල් කිරීම සඳහා සම්පත් පිටතට ඇදී යාමක් ඇතිවේ යැයි නිශ්චය කර සාධාරණ වටිනාකමක් ඇස්තමේන්තු කිරීම වෙන් කිරීම් ලෙස හඳුනා ගත හැක.

7. **විදේශ විනිමය ගණුදෙනු**

විදේශ විනිමය ගණුදෙනු සිදු කරන දිනයේදී පවතින විනිමය අනුපාතය අනුව ගිණුම්ගත කරනු ලබන අතර ගණුදෙනුව පියවන අවස්ථාවේදී මේ මගින් ලැබෙන ලාභය හෝ පාඩුව හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයේ දක්වා ඇත.

8. **විශ්‍රාම වැටුප**

1983 අංක 12 දරණ පාරිතෝෂික පනත සහ ගිණුම්කරණ ප්‍රමිති 19 යටතේ, මූලික වැටුප ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් විශේෂ ජීවන දීමනා අදාල කරගෙන ආයතනයේ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ සෑම සේවයෙකුටම සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ ගණනය කර ඇත.

9. **නිශ්චිත දායකත්ව සැලසුම**

ආයතනයේ සෑම සේවකයෙකුම සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලේ සාමාජිකයන් වන අතර ඒ සඳහා ආයතනයේ දායකත්වය මූලික වැටුප සමඟ ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් විශේෂ ජීවන දීමනාවලින් පිළිවෙලින් 12% ක් සහ 3% ක් වේ.

10. **ආදායම් හඳුනා ගැනීම**

ආයතනයේ ආදායම හඳුනාගෙන ඇත්තේ උපචිත පදනම යටතේ සේවාවන් වෙනුවෙන් ලැබෙන මුදලින් වටිනාකම එකතු කිරීමේ බද්ද, ජාතිය ගොඩනැඟීමේ බද්ද සහ වට්ටම් ඉවත් කිරීමෙනි.

11. **වියදම්**

වියදම් හඳුනාගෙන ඇත්තේ උපචිත පදනම යටතේය. ආයතනය පවත්වාගෙන යාම සහ දේපළ පිරියත සහ උපකරණ නඩත්තු කිරීම සඳහා දරණ නඩත්තු වියදම් ඇතුලු සියලුම වියදම් ආදායමට හර කර අදාළ කාල පරිච්ඡේදයේ ලාභය ගණනය කර ඇත.

12. **මූල්‍ය ප්‍රවාහය**

වක්‍ර ක්‍රමය පදනම් කරගෙන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර ඇත.

**13. රජයේ ප්‍රදාන**

රජයේ ප්‍රදාන වත්කම්වලට සම්බන්ධ වන විට සහ මුදල් ප්‍රදාන ගිණුම්ගත කරනුයේ නව ප්‍රමිතිවලට අදාලවය. (LKAS20) ට අනුව ප්‍රදාන, වියදම් හා සම්බන්ධ වනවිට, එය ආදායමක් ලෙසද අදාල කාලය තුල ක්‍රමානුකූල ක්‍රමයට එහි පිරිවැය කපා හරිනු ලැබේ.

ප්‍රදාන වත්කම් හා සම්බන්ධ වනවිට එය විලම්බිත ආදායමක් ලෙස හඳුනාගැනේ.

ආයතනයට මූල්‍ය නොවන ප්‍රදාන ලැබුනවිට එය වත්කම් හා ප්‍රදානයන්ගේ නාමික අගයට වාර්තාකරන අතර ආදායම් ප්‍රකාශනයෙහි අදාල කාලය පුරා සමාන වාර්ෂික වාරිකවලින් පෙන්නුම් කෙරේ.

## පොදු හෙළිදරව් කිරීම්

1. SLPSAS-1 සහ SLPSAS-11 දී ඇති උපදෙස් අනුව මූල්‍ය වාර්තා පිලියෙල කර ඇත.

2. **භාණ්ඩාගාර බිල්පත්, ස්ථිර තැන්පතු, කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කිරීම**
කෙටිකාලීන තැන්පනතුවල කරන ලද ආයෝජන පිරිවැය මිලට ගිණුම් ගතකර ඇත.
භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථිර තැන්පතුවල කරන ලද ආයෝජන සමුච්චිත පිරිවැය වටිනාකමට ගිණුම්වල දක්වා ඇත.
2013 වසරේදි කෙටිකාලීන තැන්පතු භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථිර තැන්පතු වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ අනෙකුත් අත්‍යාවශ්‍ය වත්කම්වල ඇතුලත් කර ඇති අතර 2014 වසරේදි එය මුදල් හා මුදලට සමාන දෑ යටතට මාරු කර ඇත.

3. **බොල් ණය වෙන්කිරීම්**
බොල් ණය වෙන්කිරීම් වෙළඳ ලැබිය යුතු දෑ යටතේ අඩුකර දක්වා ඇත.
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින් අනුව ණයගැතියන් විවිධ අයුරින් වර්ග කර ඇති අතර ඔවුන් ගෙවීමේ පිළිවෙල අනුව ණයගැතියන් වෙන්කිරීම් පහත සඳහන් පරිදි වේ.

| ණයගැති | වෙන්කිරීම් ප්‍රතිශතය |
|---|---|
| දින 90 ට අඩු | 0% |
| දින 90 සිට 180 දක්වා | 2% |
| දින 180 සිට 360 දක්වා | 3% |
| දින 360 සිට 720 දක්වා | 4% |
| දින 720 සිට 1080 දක්වා | 5% |
| දින 1080 ට වැඩි | 100% |

**4. තොග**

ආයතනය සේවා සැපයීමේදි ප්‍රයෝජනයට ගන්නා ලද පිරිවැය අඩුම උපලබ්ධි වටිනාකම අනුව දක්වා ඇති තොග මෙයින් හැඳින්වේ. තොග පිරිවැය නිශ්චය කර ඇත්තේ ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමයට වේ. (එෆ්අයිඑෆ්ඕ)

**5. පාරිතෝෂික වෙන්කිරීම්**

පාරිතෝෂික වෙන්කිරීම් මුළු මුදල 2014 වසරේ සිට ස්ථිර තැන්පතුවල ආයෝජනය කර ඇති අතර පාරිතෝෂික ප්‍රතිලාභ යටතේ දක්වා ඇත.

**6. රජයේ ප්‍රදාන**

රජයේ ප්‍රධානයන් මගින් කරන ලද ප්‍රාග්ධන මිලදී ගැනීම් සඳහා වන ක්ෂයවීම් ප්‍රමාණය විලම්බිත ආදායමක් ලෙස ගිණුම් ගතකර ඇත. රජයේ ප්‍රදානයන්ට අදාල වත්කම්වල ක්ෂය ප්‍රමාණයද විලම්බිත ආදායමට ඇතුලත් වේ.

**7. වත්කම් ප්‍රත්‍යාගණනය**

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල සම්පූර්ණ වාර්තාව මෙතෙක් ලැබී නොමැත.

**8. තත්ව වැඩි දියුණුකිරීමේ ව්‍යාපෘතිය**

තත්ව වැඩිදියුණිකිරීමේ ව්‍යාපෘතිය සඳහා වැඩියෙන් ලැබුණ මුදල අනෙකුත් උපදේශන ආදායමේ ඇතුලත් වී ඇත.

**9. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැඩසටහනේ අතිරික්තය**

සුළු හා මධ්‍ය පරිමාණ වැඩසටහන මගින් ලැබූ අතිරික්ත මුදල ආදායමේ ඇතුලත් වී ඇත.

**10. අපහරණය කරන ලද වත්කම්**

මෙම වසරේ වත්කම් අපහරණය කිරීමේ කාර්යය අවසන් වී ඇතත්, වත්කම් හඳුනාගැනීමේ සංකේත නොමැති නිසා වසර තුලදී අවශ්‍ය ගැලපීම් සිදුකර නොමැත. වත්කම් විකිණීමෙන් ලද මුදල අගය අවසන්වී ඇති වත්කම් හඳුනාගෙන ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර ඇත.

**11. කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල සඳහා වෙන්කිරීම්**

ආයතනයේ පනතට අනුව මෙම වසරේ පියවාගැනීම්වලින් 0.5% ක් ගණනය කර කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල සඳහා මුදල් වෙන්කරන ලදි.

**12. ඇඟලුම් ආශ්‍රිත කුඩා කර්මාන්ත ව්‍යාපෘතිය**

ඇඟලුම් ආශ්‍රිත කුඩා කර්මාන්ත ව්‍යාපෘතිය දිවයිනේ දිස්ත්‍රික්ක කීපයකම ස්ලිටා ආයතනය විසින් සිදුකරනු ලැබේ. මේ සඳහා වියදම අමාත්‍යාංශයෙන් නැවත ප්‍රතිපූර්ණය කරන ලදි.

## 13. සුළු ඇඟලුම් කර්මාන්ත ව්‍යාපෘතිය

සුළු ඇඟලුම් කර්මාන්ත ව්‍යාපෘතිය ස්ලිටා ආයතනය විසින් සිදුකරන අතර ඒ සඳහා වියදම අමාත්‍යාංශයෙන් නැවත ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

## 14. පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිය

කෙසෙල් කෙඳි ව්‍යාපෘතිය පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ස්ලිටා ආයතනය මගින් සිදුකරන අතර මේ සඳහා වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

## 15. ප්‍රාග්ධන ලැබීම්

පහත සඳහන් ව්‍යාපෘති සඳහා මුදල් සහ උපකරණ ප්‍රාග්ධන ලැබීම් යටතේ අමාත්‍යාංශයෙන් ලැබී ඇත.

- ගොඩනැගිලි
- තත්ව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති වැඩසටහන
- සෞඛ්‍ය හා ආරක්ෂණ ව්‍යාපෘතිය
- පාවහන් අංශයේ පුහුණු කිරීම්
- කෙසෙල් කෙඳි නූල් සංවර්ධන ව්‍යාපෘතිය
- මහන මැෂින් නඩත්තු ව්‍යාපෘතිය
- පේෂකර්ම නිමහම් කර්මාන්ත හරිතකරණ වැඩසටහන
- ඕටැක් සාමාජිකයන් පුහුණු කිරීම
- ස්ලිටා වැඩපල යාවත්කාලීන කිරීම
- පර්යේෂණාගාර උපකරණ සහ පුහුණු උපකරණ මිලදී ගැනීම

## 16. පාලමුනේ වර්ණගැන්වීමේ මධ්‍යස්ථානය

ස්ලිටා ආයතනය මගින් පවත්වාගෙන යන පාලමුනේ වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී ලාභය/අලාභය වෙනම ගණනය කර ඇත.

## 17. ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අත්තිකාරම් ගෙවීම්

ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වසරේ ප්‍රාග්ධන අනුමැතිය රු.මිලියන 75 කි. පාර්ලිමේන්තු කැබිනට් පත්‍රිකාවක් මගින් භාණ්ඩාගාරය විසින් මෙම වෙන්කිරීම සිදුකර ඇත. මෙම මුදලින් මූලික වැඩකටයුතු සඳහා රු.මිලියන 35 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මාරුකර ඇත.

## 18. ව්‍යාපෘති

ස්ලිටා ආයතනයේ මුදලින් මෙම වසර තුල ව්‍යාපෘති කිහිපයක්ම අවසන් කර ඇත. ඒ සඳහා වසර අවසානයේදී කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල රු. 41,640,890.37 කි.

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

| | සටහන් අංක | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **<u>ජංගම වත්කම්</u>** | | | |
| මුදල් හා මුදලට සමාන දෑ | 1 | 196,684,602 | 194,332,871 |
| ලැබිය යුතු | 2 | 92,730,546 | 41,372,142 |
| තොග | 3 | 3,006,954 | 3,810,204 |
| ඉදිරියට ගෙවීම් | 4 | 1,447,685 | 2,008,518 |
| ප්‍රාග්ධන වැඩ සඳහා අත්තිකාරම් ගෙවීම් | 5 | 36,805,755 | 1,048,201 |
| අනෙකුත් ජංගම වත්කම් | 6 | 9,803,464 | 6,842,493 |
| **ජංගම වත්කම් එකතුව** | | **340,479,007** | **249,414,430** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ (ශුද්ධ) | 7 | 104,132,958 | 87,613,713 |
| ඉඩම් සහ ගොඩනැඟිලි (ශුද්ධ) | 8 | 49,167,918 | 47,978,364 |
| | | 153,300,876 | 135,592,077 |
| **වත්කම් එකතුව** | | **493,779,883** | **385,006,507** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු | 9 | 11,318,721 | 12,067,055 |
| කෙටිකාලීන වෙන්කිරීම් | 10 | 2,247,802 | 1,057,000 |
| | | 13,566,523 | 13,124,055 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂිකය | 11 | 38,548,057 | 39,297,047 |
| | | 38,548,057 | 39,297,047 |
| **වගකීම් එකතුව** | | 52,114,580 | 52,421,102 |
| **ශුද්ධ වත්කම්** | | **441,665,303** | **332,585,404** |
| **<u>ශුද්ධ වත්කම්/සහභාගය</u>** | | | |
| රජයේ ප්‍රදාන සහ විදේශ ආධාර | 12 | 182,257,166 | 127,554,173 |
| අනෙකුත් ව්‍යාපෘති | 13 | 23,129,956 | 22,172,075 |
| ප්‍රත්‍යාගණිත සංචිත | 14 | - | - |
| සමුච්චිත අතිරික්තය/(ඌණතාවය) | 15 | 236,278,182 | 182,859,157 |
| **ශුද්ධ වත්කම්/සහභාගය එකතුව** | | **441,665,303** | **332,585,404** |

මෙම මූල්‍ය වාර්තා පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලයේ වගකීමකි. මෙම මූල්‍ය වාර්තා සඳහා පාලක මණ්ඩලය විසින් 2018.02.23 දිනදී අනුමැතිය ලබාදී ඇත.

| අත්සන් කළේ : | වයි ඒ පි පි යාපා<br>ගණකාධිකාරී | එම්.ඒ. තාජුඩීන්<br>සභාපති | අධ්‍යක්ෂ මණ්ඩලයේ<br>සාමාජික |
|---|---|---|---|

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශන වාර්තාව

| | සටහන් අංක | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ගාස්තු සහ අනෙකුත් | 16 | 202,882,320 | 170,024,308 |
| **මෙහෙයුම් ආදායම එකතුව** | | **202,882,320** | **170,024,308** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි (වැටුප්, වේතන සහ සේවක හිමිකම්) | 17 | 87,371,113 | 83,708,433 |
| ගමන් වියදම් | 18 | 745,075 | 433,569 |
| සැපයීම් සහ පරිභෝජන | 19 | 9,724,897 | 11,428,787 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 20 | 5,063,229 | 5,525,581 |
| ගිවිසගත් සේවා | 21 | 18,711,819 | 16,811,572 |
| ක්ෂයවීම් සහ ලියාහැරීමේ වියදම් | 22 | 21,456,927 | 21,519,946 |
| අනෙකුත් වියදම් | 23 | 24,490,637 | 14,373,160 |
| මූල්‍ය පිරිවැය | 24 | 156,506 | 114,680 |
| | | 167,720,204 | 153,915,728 |
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් වූ අතිරික්තය/(ඌණතාවය)** | | 35,162,116 | 16,108,579 |
| **අනෙකුත් ආදායම්** | | | |
| විලම්බිත ආදායම | 25 | 19,373,429 | 22,310,402 |
| **අනෙකුත් ආදායම් එකතුව** | | **19,373,429** | **22,310,402** |
| **අදාල කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌණතාවය) එකතුව** | | **54,535,545** | **38,418,981** |

මෙම මූල්‍ය වාර්තා පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලයේ වගකීමකි. මෙම මූල්‍ය වාර්තා සඳහා පාලක මණ්ඩලය විසින් 2018.02.23 දිනදී අනුමැතිය ලබාදී ඇත.

| අත්සන් කළේ : | වයි ඒ පී ජී යාපා | එම්.ඒ. තාජුඩීන් | අධ්‍යක්ෂ මණ්ඩලයේ |
|---|---|---|---|
| | ගණකාධිකාරී | සභාපති | සාමාජික |

## ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය
### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශණය

| | සටහන් | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| අදාල කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / (ඌණතාවය) | | 54,535,545 | 38,418,981 |
| **ගැලපීම්** | | | |
| විලම්බිත ආදායම ලියාහැරීම | | (19,373,429) | (22,310,402) |
| ක්ෂයවීම් | | 21,456,927 | 21,519,946 |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/(ඌණතාවය) | | 56,619,044 | 37,628,525 |
| දේපල, පිරියත සහ උපකරණ ගැලපීම් | | - | 43,800 |
| පාරිතෝෂික වෙන්කිරීම වැඩිවීම | | 3,033,726 | 2,988,298 |
| තොග වැඩිවීම /(අඩුවීම) | | 803,251 | (1,785,376) |
| ඉදිරියට ගෙවීම් වැඩිවීම /(අඩුවීම) | | 560,833 | (772,128) |
| අනෙකුත් ජංගම වත්කම් වැඩිවීම /(අඩුවීම) | | (2,960,971) | 559,840 |
| ක්ෂයවීම් ගැලපීම් | | - | (211,983) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | | (51,358,404) | (24,099,923) |
| පෙර වසරේ ඌණතාවය අඩුවීම | | (1,116,520) | 2,377,212 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම | | (748,334) | (2,419,058) |
| වෙන්කිරීම් වැඩිවීම | | 1,190,802 | (253,087) |
| පාරිතෝෂික ගෙවීම් | | (3,782,716) | (1,768,156) |
| මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 2,240,710 | 12,287,964 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය** | | | |
| පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | | (39,165,727) | (9,866,116) |
| ප්‍රාග්ධන වියදම් සඳහා අත්තිකාරම් ගෙවීම් | | (35,757,554) | (987,001) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (74,923,281) | (10,853,117) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහය** | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන (මුදල්) | | 25,000,000 | 18,364,500 |
| අඩුවෙන් දක්වා ඇති විලම්බිත ආදායම | | - | (1,664,335) |
| ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්) | | 49,076,423 | - |
| අනෙකුත් ව්‍යාපෘති වෙනස්වීම් | | 957,881 | 15,256,138 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 75,034,304 | 31,956,303 |
| මුදල් සහ මුදලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 2,351,733 | 33,391,151 |
| කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් සහ මුදලට සමාන දෑ | | 194,332,870 | 160,941,720 |
| කාලපරිච්ඡේදය අවසානයේ වූ මුදල් සහ මුදලට සමාන දෑ | (1) | 196,684,603 | 194,332,871 |

| | සටහන් | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|
| **<u>සටහන අංක 2</u>** | | | |
| **<u>මුදල් සහ මුදලට සමාන දෑ</u>** | | | |
| බැංකුවේ මුදල් | | | |
| ලංකා බැංකුව - රත්මලාන (ගි.අංක 9521019) | | 3,481,534 | |
| ලංකා බැංකුව - රත්මලාන (විදේශ විනිමය) (ගි.අංක 7011691) | | 485,572 | |
| **<u>කෙටිකාලීන ආයෝජන</u>** | | | |
| ස්ථාවර තැන්පතු - රත්මලාන | | 3,559,746 | |
| භාණ්ඩාගාර බිල්පත් (පාරිතෝෂික අරමුදල) | | 13,400,235 | |
| කෙටිකාලීන තැන්පතු (පාරිතෝෂික අරමුදල අඩංගු) | | 175,757,516 | |
| | | <u>196,684,603</u> | |

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශණය

| | සටහන් අංක | ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. | අනෙකුත් සංචිත රු. | සංචිත මාරුකිරීම් රු. | සමුච්චිත අතිරික්තය/ ඌණතාවය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| 2017.01.01 දිනට ශේෂය | 1 | 149,726,247 | - | - | 182,859,156 | 332,585,403 |
| **<u>ගිණුම් ප්‍රතිපත්ති වෙනස්වීම්</u>** | | | | | | |
| වසරේ වෙනස්වීම් | 2 | 55,660,874 | - | - | (1,116,519) | 54,544,355 |
| දේපල ප්‍රත්‍යාගණිත ලාභ | | - | - | | - | - |
| ආයෝජන ප්‍රත්‍යාගණිත අලාභ | | - | - | - | - | - |
| විදේශ විනිමය හුවමාරු අලාභ | | - | - | | - | - |
| හඳුනාගත් ශුද්ධ ආදායම | | 55,660,874 | - | - | (1,116,519) | 54,544,355 |
| වසරේ අතිරික්තය/(ඌණතාවය) | | - | - | - | 54,535,545 | 54,535,545 |
| අදාල කාලය තුල හඳුනාගත් ශුද්ධ ආදායම | | - | - | - | - | - |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **205,387,121** | **(0)** | **-** | **236,278,182** | **441,665,303** |

**<u>සහභාග්‍ය වෙනස්වීම සටහන්</u>** රු.

**<u>සටහන් අංක 1</u>**

**<u>ප්‍රාග්ධන දායකත්වය</u>**

| | |
|---|---|
| රජයේ ප්‍රදාන සහ විදේශ ආධාර 2016.12.31 දිනට ශේෂය | 139,944,934 |
| 2016.12.31 දිනට අනෙකුත් ව්‍යාපෘතිවල ඉතිරි එකතුව | 9,781,313 |
| | 149,726,247 |

**<u>සටහන් අංක 2</u>**

**<u>වසරේ වෙනස්වීම්</u>**

| | |
|---|---|
| වසරේ ප්‍රාග්ධන ප්‍රදාන | 79,796,245 |
| වසර තුල වත්කම් ලියාහැරීම් | (19,373,428) |
| පෙර වසරේ ශිෂ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම | (3,219,824) |
| පෙර වසරේ පාවහන් සංවර්ධන ව්‍යාපෘතිය | (2,500,000) |
| වසර තුල අනෙකුත් ව්‍යාපෘතිවල වෙනස්වීම් | 957,881 |
| | 55,660,874 |

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | **මූල්‍යමය වාර්තා සටහන්** | | |
| 1 | **මුදල් හා මුදලට සමාන දෑ** | | |
| | **බැංකුවේ ඇති මුදල්** | | |
| | ලංකා බැංකුව රත්මලාන ගි.අංක 9521019 | 3,481,534 | 1,574,120 |
| | ලංකා බැංකුව රත්මලාන වි.විනි.ගි.අංක 7011691 | 485,572 | 147,535 |
| | කෙටිකාලින ආයෝජන (හෙලිදරව් කිරීම් අංක 2) | 192,717,497 | 192,611,216 |
| | | **196,684,603** | **194,332,871** |
| 1.1 | **හෙලිදරව් කිරීම් අංක 2** | | |
| | **කෙටිකාලින ආයෝජන** | | |
| | ස්ථිර තැන්පතු | 3,559,746 | 3,287,310 |
| | භාණ්ඩාගාර බිල්පත් | 13,400,235 | 12,038,922 |
| | කෙටිකාලින තැන්පතු | 175,757,516 | 177,284,985 |
| | | **192,717,497** | **192,611,217** |
| 2 | **ලැබිය යුතු** | | |
| | **වෙළඳ ලැබිය යුතු (හෙලිදරව් කිරීම් අංක 3)** | | |
| | පරීක්ෂණ ණයගැතියෝ | 4,738,250 | 5,291,907 |
| | පුහුණු - අභ්‍යන්තර ණයගැතියෝ | 8,719,292 | 9,728,217 |
| | පුහුණු - බාහිර ණයගැතියෝ | 251,600 | 896,292 |
| | උපදේශන සේවා ණයගැතියෝ | 83,559 | 113,343 |
| | පාරිභෝගික/තාක්ෂණ සේවා ණයගැතියෝ | 70,800 | 119,856 |
| | සම්මන්ත්‍රණ | - | 8,160 |
| | අනෙකුත් වෙළඳ ණයගැතියෝ | 489,561 | 4,604,990 |
| | | **14,353,062** | **20,762,760** |
| | අඩුකළා - බොල් ණය වෙන්කිරීම් | 3,800,665 | (3,569,837) |
| | | **10,552,397** | **17,192,923** |
| | විවිධ ණයගැතියෝ | 82,178,149 | 24,179,219 |
| | | **92,730,546** | **41,372,142** |
| 3 | **තොග** | | |
| | ලිපිද්‍රව්‍ය | 1,024,991 | 834,015 |
| | පුහුණු අමුද්‍රව්‍ය සහ පාරිභෝජන ද්‍රව්‍ය | 1,271,778 | 189,887 |
| | අමතර කොටස් සහ උපාංග | 513,327 | 196,857 |
| | වර්ණ සහ නූල් | 196,857 | 2,589,445 |
| | | **3,006,953** | **3,810,204** |

| | | 2017 | 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | **මූල්‍යමය වාර්තා සටහන්** | | |
| **4** | **ඉදිරියට ගෙවීම්** | | |
| | රක්ෂණ - වෛද්‍ය | 227,157 | 218,405 |
| | රක්ෂණ - මෝටර් රථ | 376,167 | 326,159 |
| | රක්ෂණ - ගිනි සහ අනෙකුත් | 107,042 | 91,620 |
| | රක්ෂණ - මුදල් ප්‍රවාහණය | 6,332 | 5,982 |
| | සේවා ගිවිසුම් - පරිගණක | 44,609 | 42,107 |
| | සේවා ගිවිසුම් - පිරියත සහ යන්ත්‍රෝපකරණ | - | 76,982 |
| | සේවා ගිවිසුම් - ලි බඩු උපකරණ | 116,850 | 52,673 |
| | වාහන බලපත්‍ර | 39,540 | 34,045 |
| | තත්ව පර්යේෂණාගාර වියදම් | 529,988 | 1,153,150 |
| | නගර සභාව | - | 7,395 |
| | | **1,447,685** | **2,008,518** |
| **5** | **ප්‍රාග්ධන වැඩ සඳහා අත්තිකාරම් ගෙවීම්** | | |
| | යෝජිත නව ගොඩනැඟිලි සැලැස්ම සහ පස පරීක්ෂා කිරිම | 36,805,755 | 1,048,201 |
| | | **36,805,755** | **1,048,201** |
| **6** | **අනෙකුත් ජංගම වත්කම්** | | |
| | සේවක ණය (6.1) | 9,181,464 | 6,410,493 |
| | තැන්පතු (6.2) | 622,000 | 432,000 |
| | | **9,803,464** | **6,842,493** |
| **6.1** | **සේවක ණය** | | |
| | ආපදා ණය | 9,168,964 | 6,395,493 |
| | උත්සව අත්තිකාරම් | 12,500 | 15,000 |
| | | **9,181,464** | **6,410,493** |
| **6.2** | **තැන්පතු** | | |
| | ගෙවල් කුලි තැන්පතු | 240,000 | - |
| | විදුලිබල මණ්ඩලය | 250,000 | 250,000 |
| | ආර් එල් ප්‍රනාන්දු - ඉන්ධන | 100,000 | 100,000 |
| | ඔක්සිජන් සහ ඇසිටිසිටි සිලින්ඩර් | 12,000 | 12,000 |
| | ඩයලොග් ටෙලිකොම් රෝමින් පහසුකම් | 20,000 | 20,000 |
| | ප්‍රවාහන තැන්පතු | - | 50,000 |
| | | **622,000** | **432,000** |

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## මූල්‍යමය වාර්තා සටහන්

| | ප්‍රමාණය | 2017<br>රු. | |
|---|---|---|---|
| **7.1 <u>යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ</u>**<br>**<u>දේපල පිරියත සහ උපකරණ එකතුකිරීම්</u>** | | | |
| **<u>පිරියත සහ යන්ත්‍රෝපකරණ</u>** | | | |
| වායු සමීකරණ යන්ත්‍ර | 01 | 143,022 | |
| ස්ටෙම් කටින් මැෂිම | 01 | 275,000 | |
| ෆයිබර් එක්ස්ට්‍රැක්ට් | 01 | 175,000 | |
| මැෂිම සහ විදුලි මෝටරය | | | |
| | | 593,022 | |
| **<u>ලිබඩු, සවිකිරීම් සහ උපකරණ</u>** | | | |
| කාර්යාල පුටු | 5 | 54,685 | |
| කාර්යාල කබඩ් | 1 | 16,024 | |
| කාර්යාල පුටු | 2 | 25,155 | |
| ඉනෝවෙක්ස් එල් ඊ ඩි රූපවාහිනිය | 1 | 19,900 | |
| ඩිජිටල් ජායා පිටපත් මැෂිම (ටොෂිබා) | 1 | 725,625 | |
| වානේ කබඩ් | 1 | 18,221 | |
| නිකොන් කැමරා | 1 | 141,900 | |
| කාර්යාල පුටු | 1 | 13,207 | |
| වේදිකා තරාදි - 60 කි | 1 | 69,875 | |
| මුදල් පෙට්ටි | 1 | 3,700 | |
| අමුත්තන් පුටු | 10 | 45,687 | |
| වයිට් බෝඩ් ආධාරකය සමඟ | 2 | 17,000 | |
| ඉනිමඟ | 1 | 13,600 | |
| රාක්ක 2ක් සමඟ තේක්ක මේස | 1 | 144,840 | |
| ක්‍රිම්ප් ටෙස්ටර් | 1 | 561,119 | |
| කෝ පවර් අයි ආර් සාම්පල් ඩයි මැෂිම | 1 | 1,763,870 | |
| වානේ කැබිනෙට්ටු - 6 x 3 | 2 | 37,732 | |
| කැෂියෝ මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් | 6 | 1,472,680 | |
| ඩිජිටල් මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් | 1 | 8,500 | |
| විද්‍යුත් ශබ්දවාහිනිය (ඇපලෝ වර්ගයේ) | 1 | 26,500 | |
| විදුලි කේතලය | 1 | 4,504 | |
| ඩිජිටර් කැමරා | 1 | 179,525 | |
| වතුර පෙරනයක් | 2 | 35,000 | |
| ලියන පෑඩය සමඟ දේශනශාලා පුටු | 25 | 229,637 | |
| | | **5,628,488** | |

| | ප්‍රමාණය | 2017<br>රු. | |
|---|---|---|---|
| **පර්යේෂණාගාර උපකරණ** | | | |
| හාර්ඩ්නස් ටෙස්ටර් - සපත්තු | 1 | 183,000 | |
| මැග්නටික් ස්ටීමර් සමඟ උණුසුම් උදුන | 1 | 81,500 | |
| FTIR පද්ධතිය | 1 | 4,920,000 | |
| ගෑස් ක්‍රෝමොටොග්‍රාෆ් මාස්ස්පෙක්ට්‍රොමීටර් | 1 | 12,681,850 | |
| මාර්ටින් ඩේල් ඇබ්රේෂන් පිලින් ටෙස්ටර් | 1 | 3,161,688 | |
| විදුලි තරාදිය | 1 | 84,300 | |
| | | **21,112,339** | |
| **පරිගණක** | | | |
| විදුලි ගබඩාකිරීමේ උපකරණ | 1 | 9,455 | |
| විදුලි ගබඩාකිරීමේ උපකරණ ප්‍රෝ 700 | 3 | 12,750 | |
| පරිගණක HP | 1 | 130,000 | |
| ලැප්ටොප් පරිගණක | 5 | 835,000 | |
| ගර්බර් අකුමාක් පද්ධතිය | 1 | 871,934 | |
| ටැබ් - සැම්සුන් ගැලැක්සි | 1 | 115,000 | |
| විදුලි ගබඩාකිරීමේ උපකරණ | 1 | 220,600 | |
| ලැප්ටොප් පරිගණක | 1 | 167,000 | |
| මල්ටිමීඩියා, සීපියු, කීබෝඩ්, මවුස් | 18 | 1,350,000 | |
| ටැබ් - සැම්සුන් ගැලැක්සි | 2 | 219,998 | |
| | | **3,931,737** | |
| **කාර්මික මහන මැෂින්** | | | |
| සපත්තු මැෂිම තනි නූල | 4 | 2,469,595 | |
| ලොක්ස්ටිච් මැෂිම තනි නූල | 10 | 2,289,750 | |
| | | **4,759,345** | |
| **පොත් සහ සඟරා** | 2 | 6,500 | |
| ස්ටැන්ඩර්ඩ් බිඩින් ලියවිල්ල | 2 | 140 | |
| ආයතන රෙගුලාසි පොත් | 1 | 430 | |
| මුදල් රෙගුලාසි පොත | 1 | 810 | |
| රජයේ මුදල් කළමනාකරණය | 1 | 630 | |
| මුදල් රෙගුලාසි | 2 | 1,260 | |
| ආයතන ක්‍රියාකාරකම් | 5 | 23,921 | |
| බතික් පොත් | 2 | 2,646 | |
| එම්බ්‍රොයිඩර් මැෂින් | 1 | 2,047 | |
| ෂර්ට් සැදීම | 1 | 2,090 | |
| එලලන වැඩ | 1 | 1,080 | |
| ක්ලැසික් කුයිල්ට්ස් | 1 | 1,525 | |
| කම්කරු නීතිය | 1 | 1,620 | |
| ස්කැන්ඩිනේවියන් මැෂිම | 1 | 5,616 | |
| කුයිල්ටන් එලලන වැඩ සහ ඇප්ලික් | 1 | 1,125 | |
| ඇක්ටික් කුයිල්ට්ස් | 2 | 4,615 | |
| මහන පොත් | | | |
| | | **56,055** | |

## 8. 2017.12.31 දිනට ඉඩම් සහ ගොඩනැගිලි

| | ඉඩම් රුපි | ගොඩනැගිලි රුපි | එකතුව රුපි |
|---|---|---|---|
| **පිරිවැය** | | | |
| 2017.01.01 දිනට පිරිවැය | 5,018,434 | 74,236,658 | 79,255,092 |
| එකතුකිරීම් - සටහන 8.1 | - | 3,084,741 | 3,084,741 |
| වත්කම් ගැලපීම් | - | - | - |
| 2017.12.31 දිනට පිරිවැය | 5,018,434 | 77,321,399 | 82,339,833 |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | |
| 2017.01.01 දිනට සමුච්චිත ක්ෂය | - | 31,276,729 | 31,276,729 |
| වසර සඳහා ක්ෂයවීම් | - | 1,895,187 | 1,895,187 |
| සමුච්චිත ක්ෂය සඳහා ගැලපීම් | - | - | - |
| 2017.12.31 දිනට සමුච්චිත ක්ෂය | - | 33,171,915 | 33,171,915 |
| 2017.12.31 දිනට ශුද්ධ පොත් අගය | 5,018,434 | 44,149,484 | 49,167,918 |

### 8.1 ඉඩම් සහ ගොඩනැගිලි

| | |
|---|---|
| ශිෂ්‍යයන් සඳහා පිරිසිදුකිරීමේ ගොඩනැඟිල්ල ඉදිකිරීම | 3,084,741 |
| | **3,084,741** |

| | | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 9 | **<u>ගෙවිය යුතු දෑ</u>** | | | |
| | වෙළෙඳ ණයහිමියෝ | 9.1 | 776,076 | 784,131 |
| | උපචිත වියදම් | 9.2 | 6,059,733 | 3,938,574 |
| | විවිධ ණයහිමියෝ | 9.3 | 4,231,273 | 7,041,661 |
| | ගෙවිය යුතු ජංගම බදු | 9.4 | 251,639 | 302,689 |
| | | | **11,318,721** | **12,067,055** |
| 9.1 | **<u>වෙළෙඳ ණයහිමියෝ</u>** | | | |
| | **<u>අත්තිකාරම් වශයෙන් ලැබුණු මුදල්</u>** | | | |
| | ශිෂ්‍යයන්ගෙන් පාඨමාලා ගාස්තු සඳහා | | | |
| | ලැබුණු අත්තිකාරම් මුදල් | | 776,076 | 776,671 |
| | වෙළඳ ණයගැතියන්ගෙන් වැඩිපුර ලැබුණ මුදල් | | - | 7,460 |
| | | | **776,076** | **784,131** |
| 9.2 | **<u>උපචිත වියදම්</u>** | | | |
| | තාවකාලික පුහුණු හා වැටුප් දීමනා | | - | 171,569 |
| | සතිඅන්ත දීමනා | | 939,959 | 892,583 |
| | ප්‍රවාහණ | | 211,998 | 146,370 |
| | දුරකථන දීමනා | | 1,800 | 900 |
| | සම්බන්ධීකරණ ගාස්තු | | 112722 | 83,543 |
| | මුද්දර බදු | | 12,100 | 13,800 |
| | මෝටර් රථ අළුත්වැඩියා | | 125,025 | 2,400 |
| | පිරියත සහ යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා | | - | 18,870 |
| | ගොඩනැගිලි අළුත්වැඩියා | | 17,009 | - |
| | කෙසෙල් කෙඳි සංවර්ධන ව්‍යාපෘතිය | | 37,187 | |
| | ආර්ථික සේවා ගාස්තු | | 241,806 | |
| | සේවක අර්ථසාධක අරමුදල | | 1,037,482 | |
| | සේවක භාරකාර අරමුදල | | 141,475 | |
| | ශිෂ්‍ය පහසුකම් වැඩි දියුණුකිරීම | | 283,756 | |

| | | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| | අතිකාල දීමනා | | 452,846 | 332,590 |
| | ගමන් වියදම් | | 73,750 | 68,150 |
| | උපයෝගි සේවා (ජල) | | 22,015 | 8,720 |
| | විදුලිය | | 832,411 | 601,620 |
| | ආරක්ෂක ගාස්තු | | 166,675 | 140,740 |
| | සන්නිවේදන සේවා | | 100,479 | 86,361 |
| | වාහන සහ ජෙනරේටර් සඳහා ඉන්ධන | | 55,253 | 127,552 |
| | ලිබඩු උපකරණ සහ සවිකිරීම් අළුත්වැඩියා | | - | 2,500 |
| | සේවක සුභසාධක වෛද්‍ය යෝජනා ක්‍රමය | | 83,589 | 47,247 |
| | සනිපාරක්ෂක සේවා | | 275,630 | 268,614 |
| | ගෝස් පරීක්ෂණ වියදම් | | 21,600 | 12,600 |
| | කාර්යාල ගෙවල්කුලි | | 80,000 | - |
| | දැන්වීම් ගාස්තු | | - | 10,000 |
| | සාමාජික ගාස්තු අළුත්කිරීම් | | 4,347 | - |
| | පරිභෝජන මිලදීගැනීම් | | - | 2,800 |
| | ආරක්ෂක නිලඇඳුම් පරීක්ෂා වියදම් | | 1,233 | - |
| | කතිකාචාර්ය ගාස්තු (ආරාධිත) | | 297,044 | 156,300 |
| | ABC ව්‍යාපෘති වියදම් | | 112,805 | - |
| | පිරියත සහ යන්ත්‍රෝපකරණ | | - | 144,000 |
| | පුවත්පත් ගාස්තු | | - | 3,410 |
| | මන්නාරම් ශාඛාව | | 11,577 | 63,067 |
| | අත්යන්ත්‍ර වර්ණගැන්වීමේ ව්‍යාපෘතිය | | 107,071 | 143,338 |
| | තත්ව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | | 112,992 | 98,485 |
| | පුහුණු පාඨමාලා වියදම් | | 6,095 | 1,615 |
| | ගොඩනැඟිලි | | - | 284,829 |
| | අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | | - | 4,000 |
| | උපාධි පිරිනැම්ම වෙනුවෙන් වියදම් | | 80,000 | - |
| | | | **6,059,733** | **3,938,574** |
| 9.3 | **විවිධ ණයහිමියෝ** | | | |
| | විවිධ ණයහිමියෝ | | 153,950 | 153,950 |
| | මහා භාණ්ඩාගාරය | | 3,871,448 | 3,871,448 |
| | උපදේශන අත්තිකාරම් | | 20,000 | - |
| | ආපනශාලා ටෙන්ඩර් තැන්පතු | | 15,000 | 15,000 |
| | බිඩ් ආරක්ෂණ | | 25,500 | 107,500 |
| | ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පතු | | 45,375 | - |
| | මොරටුව විශ්ව විද්‍යාලය සමඟ පවත්වන පර්යේෂණ සහ සංවර්ධන කෙසෙල් කෙඳි ව්‍යාපෘතිය | | - | 2,893,763 |
| | ආපසු ගෙවන තැන්පතු | | 100,000 | - |
| | | | **4,231,273** | **7,041,662** |
| 9.4 | **ගෙවිය යුතු ජංගම බදු** | | | |
| | ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | | 251,639 | 302,689 |
| | | | **251,639** | **302,689** |

| | | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 10 | **<u>කෙටිකාලීන වෙන්කිරීම්</u>** | | | |
| | සේවක සංවර්ධන අරමුදල | | 790,802 | - |
| | විගණන ගාස්තු වෙන්කිරීම් | | 1,457,000 | 1,057,000 |
| | | | **2,247,802** | **1,057,000** |
| 11 | **<u>විශ්‍රාම වැටුප</u>** | | | |
| | **<u>පාරිතෝෂික වෙන්කිරීම්</u>** | | | |
| | **<u>(හෙළිදරව් කිරීම් අංක 6)</u>** | | | |
| | වසර මුල ශේෂය | | 39,297,047 | 38,076,905 |
| | අඩුකළා - වසරේ ගෙවීම් | | (3,782,716) | (1,768,156) |
| | | | 35,514,331 | 36,308,749 |
| | වසර සඳහා වෙන්කිරීම් | | 3,033,726 | 2,988,298 |
| | වසර අවසානයේ ශේෂය | | **38,548,057** | **39,297,047** |
| 12 | **<u>රජයේ ප්‍රදාන සහ විදේශ ආධාර</u>** | | | |
| | **<u>(හෙළිදරව් කිරීම් අංක 7)</u>** | | | |
| | 2017.01.01 දිනට ශේෂය | | 121,834,349 | 133,028,997 |
| | එකතුකළා - වසරේ ප්‍රදාන | | 79,796,245 | 18,364,500 |
| | | | 201,630,594 | 151,393,497 |
| | පෙර වසරේ වැඩියෙන් සඳහන් කල විලම්බිත ආදායම | | | (1,664,335) |
| | අඩුකළා - වසරේ ලියාහැරීම් | | (19,373,429) | (22,174,989) |
| | වසර අවසාන ශේෂය | | **182,257,165** | **127,554,173** |
| 13 | **<u>අනෙකුත් ව්‍යාපෘති</u>** | | | |
| | සෞඛ්‍ය හා ආරක්‍ෂණ ව්‍යාපෘතිය | | 1,406,663 | - |
| | නව කෙසෙල් කෙඳි නූල් සංවර්ධන වැඩසටහන | | 10,061,506 | - |
| | අත්යන්ත්‍ර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | | 140,235 | 1,036,404 |
| | සුළු පරිමාණ ඇඟලුම් ගුරුවරු පුහුණුකිරීමේ ව්‍යාපෘතිය | | 688,515 | 4,203,653 |
| | අත්යන්ත්‍ර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - මරදමුනෙයි | | 2,243,450 | 2,882,179 |
| | වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශය ශිෂ්‍යත්ව අරමුදල | | 236,867 | 236,867 |
| | ශිෂ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම | | 135,083 | - |
| | පාවහන් සංවර්ධන වැඩසටහන | | 30,405 | - |
| | ඇඟලුම් ආශ්‍රිත කුඩා කර්මාන්ත වැඩසටහන | | 6,719,351 | - |
| | මහන මැෂින් නඩත්තු වැඩසටහන | | 1,047,344 | - |
| | පේෂකර්මාන්ත නිමහම් හරිතකරණ වැඩසටහන | | 420,537 | - |
| | ගෘහාශ්‍රිත ඇඟළුම් කර්මාන්ත වැඩසටහන | | 6,719,351 | 13,812,971 |
| | | | **23,129,956** | **22,172,075** |
| 14 | **<u>ප්‍රත්‍යාගණිත සංචිත</u>** | | | |
| | වසර මුල ශේෂය | | | 135,412 |
| | ප්‍රත්‍යාගණිත සංචිත ලියාහැරීම් | | | (135,412) |
| | | | | - |
| | | | | |

| | | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 15 | **<u>සමුච්චිත අතිරික්තය/(ඌණතාවය)</u>** | | | |
| | ඉදිරියට ගෙන ආ ලාභය | | 182,859,156 | 142,062,963 |
| | **<u>ශේෂපත්‍ර දිනට පසුව ඇති වූ පෙර වසරේ ගැලපීම්</u>** | | | |
| | 2015 අඩුවෙන් සටහන් කල ක්ෂයවීම් | | - | (26,040) |
| | විලම්බිත ආදායම වැරදි නිවැරදි කිරීම | | - | 1,664,335 |
| | ස්ථාවර තැන්පතු පොලි ගැලපීම | | 13,580 | - |
| | සුළු පරිමාන ඇඟළුම් ගුරුවරු පුහුණු වැඩසටහනේ ආරාධිත දේශක ගාස්තු | | (72,000) | - |
| | පාලමුනේ වර්ණගැන්වීමේ මධ්‍යස්ථානය අවසාන තොග ගැලපීම | | (1,058,070) | - |
| | වවුවර අවලංගු කිරීම | | - | 8,000 |
| | කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන | | - | 653,087 |
| | නැතිවු ලැප්ටොප් පරිගණකය වෙනුවෙන් නොගෙවු පාරිතෝෂික දීමනා 2014 | | - | (46,500) |
| | උපයන විට ගෙවීමේ බදු නිවැරදි කිරීම | | - | (2,000) |
| | ස්ථාවර තැන්පතු පොළී නිවැරදි කිරීම 2015 | | - | 126,329 |
| | | | 181,742,636 | 144,440,175 |
| | වසරේ අතිරික්තය | | 54,535,545 | 38,418,981 |
| | | | **236,278,181** | **182,859,156** |
| 16 | **<u>මෙහෙයුම් ආදායම්</u>** | | | |
| | පරීක්ෂණ | | 48,645,837 | 44,873,465 |
| | පුහුණුකිරීම් | | 113,797,288 | 90,890,335 |
| | උපදේශක සේවා | | 5,248,320 | 4,246,679 |
| | පාරිභෝගික/තාක්ෂණික සේවා සහ අනෙකුත් විකුණුම් | | 13,296,105 | 11,874,477 |
| | සම්මන්ත්‍රණ | | - | 42,500 |
| | අනෙකුත් ආදායම් | | 24,506,443 | 15,972,444 |
| | එස්.එම්.ඊ. ව්‍යාපෘතියෙන් වැඩිපුර ලැබූ මුදල් | | 3,771 | 3,110 |
| | වත්කම් විකිණීමෙන් වැඩිපුර ලැබූ මුදල | | 26,100 | - |
| | පාලමුනේ වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයේ නූල් විකිණීමෙන් ලාභ | | (2,641,544) | 2,121,297 |
| | | | **202,882,320** | **170,024,307** |

| | | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| 17 | **පුද්ගල පඩිනඩි(වැටුප්,වේතන සහසේවක හිමිකම්)** | | | |
| | වැටුප් හා වේතන (අන්තර් දීමනා ඇතුලත්) | | 37,186,028 | 35,467,254 |
| | ජීවන වියදම් දීමනාව | | 7,996,061 | 8,269,720 |
| | සේවක අර්ථසාධක අරමුදල | | 5,972,007 | 6,399,723 |
| | සේවක භාරකාර අරමුදල | | 1,439,212 | 1,597,699 |
| | විශේෂ දීමනා - 5% | | - | 476,230 |
| | සභාපති දීමනා | | 450,000 | 450,000 |
| | තාවකාලික වැටුප්/පුහුණු දීමනා | | 1,250,655 | 2,096,624 |
| | අතිකාල දීමනා | | 5,354,591 | 3,030,016 |
| | සතිඅන්ත දීමනා | | 11,663,204 | 9,779,404 |
| | ඇගයීමේ දීමනා | | 1,429,500 | 1,387,000 |
| | පාලක මණ්ඩල ලේඛක ගාස්තු | | 60,000 | 60,000 |
| | සතිඅන්ත පාසල් දීමනා | | 408,000 | 378,000 |
| | ප්‍රවාහන දීමනාව | | 4,302,050 | 2,800,000 |
| | සම්බන්ධීකරණ ගාස්තු | | 912,540 | 937,316 |
| | පර්යේෂණාගාර සේවක දීමනා | | 423,000 | 378,000 |
| | පාරිතෝෂික | | 3,033,726 | 2,988,298 |
| | ගැලපීම් දීමනාව | | 4,473,211 | 6,600,940 |
| | 2011-2014 - ගෙවිය යුතු හිඟ වැටුප් | | 16,328 | - |
| | දුරකථන දීමනා | | 344,000 | 342,900 |
| | වෘත්තිමය දීමනා | | 657,000 | - |
| | | | **87,371,113** | **83,708,432** |
| 18 | **ගමන් වියදම්** | | | |
| | දේශීය | | 745,075 | 433,569 |
| | | | **745,075** | **433,569** |
| 19 | **සැපයීම් හා පරිභෝජන වියදම්** | | | |
| | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 19.1 | 2,489,566 | 2,910,960 |
| | අනෙකුත් පරිභෝජන ද්‍රව්‍ය | 19.2 | 1,018,673 | 2,069,434 |
| | පැවරීමේ හා සහතික කිරීමේ ගාස්තු | | 2,318,320 | 2,675,310 |
| | වාහන සහ විදුලි උත්පාදක යන්ත්‍ර සඳහා ඉන්ධන | | 3,898,338 | 3,773,082 |
| | | | **9,724,897** | **11,428,787** |
| 19.1 | **ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා** | | | |
| | වර්ෂයේ ආරම්භක තොගය | | 834,015 | 682,024 |
| | එකතුකළා - වර්ෂය තුළ ගැණුම් | | 2,680,542 | 3,062,951 |
| | | | 3,514,557 | 3,744,975 |
| | අඩුකළා - වර්ෂ අවසාන තොගය | | (1,024,991) | (834,015) |
| | | | **2,489,566** | **2,910,960** |
| 19.2 | **පුහුණුකිරීමේ අමුද්‍රව්‍ය, අනෙකුත් පරිභෝජන, තත්ව පාලන පර්යේෂණාගාර අමුද්‍රව්‍ය** | | | |
| | වර්ෂයේ ආරම්භක තොගය | | 189,887 | 1,145,947 |
| | එකතු කළා - වර්ෂය තුළ ගැණුම් | | 2,100,564 | 1,113,375 |
| | | | 2,290,451 | 2,259,322 |
| | අඩුකළා - වර්ෂ අවසාන තොගය | | (1,271,778) | (189,887) |
| | | | **1,018,673** | **2,069,435** |

| 20 | **අළුත්වැඩියා හා නඩත්තු වියදම්** | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| | ඉඩම් හා ගොඩනැගිලි | | 566,708 | 932,907 |
| | මෝටර් රථවාහන | | 2,371,545 | 2,475,596 |
| | ලිබඩු සවිකිරීම් සහ උපකරණ | | 443,122 | 502,814 |
| | පර්යේෂණාගාර උපකරණ | | 639,249 | 429,134 |
| | පිරියත හා යන්ත්‍රෝපකරණ | 20.1 | 379,581 | 494,702 |
| | පරිගණක | | 427,390 | 621,810 |
| | විදුලි උත්පාදක යන්ත්‍ර | | 235,634 | 68,616 |
| | | | **5,063,229** | **5,525,581** |
| 20.1 | **යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම්** | | | |
| | වර්ෂ ආරම්භක තොග | | 196,857 | 196,857 |
| | වර්ෂය තුළ අමතර කොටස් මිලදී ගැනුම් | | - | - |
| | අළුත්වැඩියා හා නඩත්තු | | 379,581 | 494,702 |
| | | | 576,438 | 691,559 |
| | අඩුකළා - වර්ෂ අවසාන තොග | | (196,857) | (196,857) |
| | යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම්වලට මාරු කළා | | **379,581** | **494,702** |
| 21 | **ගිවිසුම්ගත සේවා** | | | |
| | කාර්යාල කුලී | | 560,532 | - |
| | රක්ෂණ | | 149,162 | 145,063 |
| | ආරක්ෂක ගාස්තු | | 1,745,999 | 1,746,042 |
| | සනීපාරක්ෂක සේවා | | 3,238,623 | 3,134,945 |
| | විදුලි වියදම් | | 7,813,409 | 7,698,673 |
| | ජලය (උපයෝගී සේවා) | | 510,434 | 325,594 |
| | සන්නිවේදන සේවා | | 1,025,876 | 923,177 |
| | තැපැල් ගාස්තු | | 164,002 | 157,473 |
| | දැන්වීම් ගාස්තු | | 849,276 | 654,109 |
| | ප්‍රවාහන ගාස්තු | | 2,654,506 | 2,026,494 |
| | | | **18,711,819** | **16,811,572** |
| 22 | **ක්ෂයවීම්** | | | |
| | ගොඩනැගිලි | | 1,895,187 | 1,821,024 |
| | පරිගණක | | 2,436,010 | 4,294,284 |
| | ලිබඩු, සවිකිරීම් සහ උපකරණ | | 4,354,905 | 4,131,296 |
| | මොටර් රථවාහන | | 2,048,892 | 2,048,891 |
| | පිරියත සහ යන්ත්‍රෝපකරණ | | 1,962,796 | 1,895,234 |
| | කාර්මික මහන යන්ත්‍රෝපකරණ | | 1,267,139 | 978,529 |
| | පර්යේෂණාගාර උපකරණ | | 6,936,062 | 5,772,163 |
| | වීඩියෝ වැඩසටහන් | | 52,500 | 52,500 |
| | පොත් සහ සඟරා | | 164,388 | 186,974 |
| | අමතර කොටස් සහ උපාංග | | 339,048 | 339,049 |
| | | | **21,456,927** | **21,519,945** |

| | සටහන 23 | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| | **අනෙකුත් වියදම්** | | | |
| | උපාධි ප්‍රදාන තත්වය ලබාගැනීමේ වියදම් | | 791,647 | - |
| | දිවියට උදාන වැඩසටහන | | 115,016 | - |
| | ආර්ථික සේවා ගාස්තු | | 658,985 | - |
| | බාහිර දේශණ ගාස්තු | | 2,907,175 | 1,969,231 |
| | විගණන ගාස්තු වෙන්කිරීම් | | 400,000 | 400,000 |
| | පුහුණු පාඨමාලා වියදම් | | 5,710,492 | 2,153,791 |
| | අනෙකුත් වියදම් | 23.1 | 416,228 | 1,109,772 |
| | මන්නාරම් ශාඛාවේ වියදම් | 23.2 | 108,889 | 1,228,112 |
| | මානව සම්පත් වර්ධනය - දේශීය | | 1,295,115 | 390,103 |
| | මානව සම්පත් වර්ධනය - විදේශීය | | 1,207,065 | 1,207,643 |
| | සේවක සුභසාධක - තේ වියදම් | | 939,447 | 836,475 |
| | සේවක වෛද්‍ය සුභසාධක යෝජනා ක්‍රමය | | 1,523,246 | 1,300,078 |
| | සුභසාධක සංගමය | | 1,700,000 | 200,000 |
| | පාලක මණ්ඩල දීමනා | | 460,000 | 489,400 |
| | ප්‍රදර්ශන වියදම් | | 538,817 | 249,220 |
| | මුද්දර ගාස්තු | | 63,220 | 46,750 |
| | වෘත්තිය මඟපෙන්වීමේ වැඩසටහන | | 233,723 | 58,820 |
| | බොල්ණය වෙන්කිරීම් | | 230,828 | - |
| | පර්යේෂණ සහ සංවර්ධන අංශ වියදම් | | 9,000 | 121,125 |
| | CSR වැඩසටහන | | - | 6,020 |
| | ගෝස් පරීක්‍ෂා කිරීමේ වියදම් | | 282,900 | 253,300 |
| | පාසල් නිළ ඇඳුම් පරීක්‍ෂා කිරීමේ වියදම් | | 18,652 | 54,241 |
| | රඳවා ගැනීමේ බදු | | 2,056,596 | 1,210,349 |
| | ජාතිය ගොඩනැගීමේ බදු 2% | | 19,564 | 39,178 |
| | ටී.ජ්.සී. සහ එම්.බී.ටී. සාමාජික දීමනා | | 163,000 | 101,250 |
| | නීති ගාස්තු | | 32,700 | - |
| | විගණන සහ කළමනාකරණ කමිටු දීමනා | | 136,654 | 114,675 |
| | වෘතිය සාමාජික ගාස්තු | | 145,403 | 107,811 |
| | වාර්ෂික අළුත්කිරීමේ ගාස්තු | | 21,286 | 45,419 |
| | ආහාරපාන සඳහා වියදම් | | 184,145 | 133,375 |
| | සහතිකපත් ප්‍රදාන උත්සවය | | 25,565 | - |
| | අයි එස් ඕ - 9001-2015 | | - | 90,000 |
| | ප්‍රකාශන සහ සඟරා | | 1,094,830 | 446,400 |
| | අගය එකතුකිරීමේ බද්ද | | 209,646 | 10,620 |
| | සේවක සංවර්ධන අරමුදල | | 790,802 | - |
| | | | **24,490,637** | **14,373,160** |
| 23.1 | **විවිධ වියදම්** | | | |
| | පුවත්පත් බිල්පත් | | 39,690 | 31,990 |
| | කම්කරු ගාස්තු | | 4,135 | 12,250 |
| | රියදුරන් සඳහා නිලඇඳුම් | | - | 54,000 |
| | රියදුරන්ගේ වෛද්‍ය පරීක්‍ෂණ වියදම් | | - | 11,275 |
| | ගෞරව දීමනා ගාස්තු | | 65,000 | 28,500 |
| | පරිවර්තන ගාස්තු - වාර්ෂික වාර්තා සහ අනෙකුත් | | 30,205 | 24,219 |
| | වාහන ගාල් කිරීමේ ගාස්තු (බී.ඕ.අයි.) | | 4,049 | 900 |
| | බෙහෙත්/සිසුන් සඳහා වෛද්‍ය ප්‍රථමාධාර | | 6,776 | 8,161 |

| | | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| | පොත් සහ වාර්තා බැඳීම | | 2,014 | 8,725 |
| | පොල් කැඩීමේ වියදම් | | 1,600 | - |
| | වීසා ඡායාරූප | | 2,300 | - |
| | ටෙන්ඩර් ලියවිලි | | 2,000 | - |
| | කෑම බීම වියදම් | | 16,371 | - |
| | ඇගයීමේ ත්‍යාග | | 6,910 | - |
| | අළුත් අවුරුදු සුභපැතුම් | | 57,575 | - |
| | පේෂකර්ම ආයතනය | | 15,000 | - |
| | බිත්ති ඔරලෝසුව | | 3,320 | - |
| | මාළු ටැංකිය | | 3,200 | - |
| | පිරිත් උත්සවය වියදම් | | 35,000 | - |
| | අරණායක භූ චලනයෙන් අනාථ - ආධාර | | - | 10,000 |
| | වෙසක් සැරසිලි | | 67,874 | 80,200 |
| | කුණුකසල ඉවත්කිරීමේ වියදම් | | 25,199 | 10,353 |
| | හැඳුනුම්පත් කාර්ය මණ්ඩල | | - | 43,830 |
| | කාර්ය මණ්ඩල වැහි කබා | | - | 12,939 |
| | බොල් ණය | | - | 754,318 |
| | ඇඳුම් පිරිසිදු කිරීමේ ගාස්තු | | 1,000 | 2,085 |
| | රියදුරු බලපත්‍ර දීමනා | | 2,700 | 2,200 |
| | සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | | 8,000 | 8,000 |
| | අනෙකුත් වියදම් | | 16,310 | 5,827 |
| | | | **416,228** | **1,109,771** |
| 23.2 | <u>**මන්නාරම් ශාඛාව වියදම්**</u> | | | |
| | ඉන්ධන | | - | 67,325 |
| | තොග ගණන් ගැනීම | | 18,351 | 11,875 |
| | ගෙවල් කුලී | | - | 195,067 |
| | පාරිභෝජන මිලදීගැනීම් | | - | 9,672 |
| | වැටුප් | | 42000 | 307,000 |
| | ආරක්ෂණ | | - | 483,091 |
| | ලී බඩු ප්‍රවාහන වියදම් පාලමුනේ | | - | 24,625 |
| | අතිකාල, ගමන්වියදම්, සතිඅන්ත දීමනා | | 25,850 | 96,775 |
| | විදුලිය | | 11,820 | 466 |
| | ජල වියදම් | | 10,868 | 8,292 |
| | දුරකථන | | - | 23,923 |
| | | | **108,889** | **122,8111** |
| | | | **19,373,429** | **22,310,401** |

| | | | 2017 (රු.) | 2016 (රු.) |
|---|---|---|---|---|
| | **සටහන 24** | | | |
| | **මූල්‍ය පිරිවැය** | | | |
| | විදේශ විනිමය පාඩු | | 598 | 1,355 |
| | බැංකු ගාස්තු | | 155,908 | 113,325 |
| | | | **156,506** | **114,680** |
| | **සටහන 25** | | | |
| | **විලම්බිත ආදායම** | | | |
| | රජයේ ප්‍රදානයන්ගෙන් මිලදී ගන්නා ලද ස්ථාවර වත්කම්වල ක්ෂයවීම් | | 19,373,429 | 19,378,621 |
| | ප්‍රත්‍යාගණිත සංචිත ක්‍රමක්ෂය | | - | 135,412 |
| | මානව සම්පත් සංවර්ධනය සඳහා රජයේ අනුග්‍රහය | | - | 2,796,368 |
| | | | **19,373,429** | **22,310,401** |

# ක්‍රියාකාරකම් දැක්වෙන දර්ශක












# මූල්‍ය ප්‍රකාශන වාර්තාව

## ආදායම

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය වාර්තා කල මුළු වාර්ෂික ආදායම රු. මිලියන 202 කි. මෙය 2016 වර්ෂය සමග සැසඳීමේදී 19% ක වැඩිවීමක් වන අතර පසුගිය වසර පහක කාලය ඇතුලත ලැබූ ඉහළම ආදායම විය. මෙය පුහුණු ආදායම වැඩිවීම නිසා සිදුවී ඇත.




## ක්‍රියාකාරී ආදායම

මෙහෙයුම් ආදායමෙන් 82% ක් තත්ව පරීක්ෂණ, පුහුණු කිරීම් සහ උපදේශන සේවා මගින් වන අතර පොළී ආදායම (ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ කෙටිකාලීන තැන්පතු පොළී) ප්‍රවාහන ආදායම සහ අනෙකුත් ආදායම් මගින් 11% ක් ලැබූ අතර තාක්ෂණ සේවා මගින් ලැබුණු ආදායම 7% කි. කෙසේ නමුත් පුහුණුකිරීම්වලින් ලැබූ ආදායම මෙම වසරේදී ප්‍රධාන ආදායම් මාර්ගය
විය.




## පරීක්ෂණ ආදායම

මෙම වසර තුලදී ආයතනය විසින් පිරිවිතර 5619 කින් පරීක්ෂණ 49,529 මගින් රු. මිලියන 48.64 ක ආදායමක් ලැබීය. මෙය පසුගිය වසර සමඟ සැසඳීමේදී 8% ක වැඩිවීමකි.






## පුහුණු කිරීම් සහ උපදේශක සේවා

2017 වසරේදී පුහුණුකිරීම්, ආයතනයේ මූලික සේවාව වූ අතර ආයතනයේ වාර්තා අනුව පුහුණු පාඨමාලා 201 ක් පුහුණුවන්නන් 5,409 කගේ සහභාගිත්වයෙන් පවත්වා ඇත. පුහුණු පාඨමාලා මගින් ලැබූ ආදායම රු. මිලියන 113.8 ක් වූ අතර එය 2016 වසරේදී රු. මිලියන 90.8 කි. එය 2016 වසර සමඟ සැසඳීමේදී 25% ක වැඩිවීමකි. පසුගිය වසරයන් සමඟ සැසඳීමේදී පුහුණුකිරීම් මගින් ලැබූ වැඩිම ආදායම මෙය විය.




## අනෙකුත් ක්‍රියාකාරකම් මගින් ලැබූ ආදායම

අනෙකුත් ආදායමෙහි ප්‍රධානතම ආදායම් මාර්ගය වූයේ ස්ථිර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ කෙටිකාලීන තැන්පතු ආයෝජන මගින් ලැබූ පොළී ආදායම වන අතර ප්‍රවාහන ආදායම සහ ආපදා ණය පොළී ආදායමද ඊට ඇතුලත් වේ. අනෙකුත් විවිධ ක්‍රියාකාරකම් වලින් එනම් නියැදි වර්ණ ගැන්වීම, අපනශාලා කුලිය, ටෙන්ඩර් තැන්පතු ගාස්තු, ජායා පිටපත් ගාස්තු වලිනි.

## වියදම්

| | 2017<br>රු.මිලියන | 2016<br>රු.මිලියන |
|---|---|---|
| මෙහෙයුම් ආදායම | 202.88 | 170.00 |
| **අඩු කළා** | | |
| මුළු මෙහෙයුම් වියදම | 167.72 | 153.91 |
| මෙහෙයුම් ලාභ/පාඩු | 35.16 | 16.09 |
| විලම්බිත ආදායම | 19.37 | 22.31 |
| අදාල කාලය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌණතාවය) | 54.53 | 38.40 |

මෙම වසර සඳහා මුළු පුනරාවර්තන වියදම රු. මිලියන 167.72 ක්වූ අතර එය පසුගිය වසරේදි රු. මිලියන 153.91 කි. පසුගිය වසර හා සැසඳීමේදි මෙය 9% ක වැඩිවීමකි.

පුනරාවර්තන වියදමෙහි පරිපාලන සැපයුම් හා පරිභෝජන, කොන්ත්‍රාත් සේවා, නඩත්තු වියදම්, ක්ෂයවීම්, පාරිතෝෂික වෙන්කිරීම් හා අනෙකුත් වියදම් අඩංගු වේ.

## මූල්‍ය ව්‍යුහය

දේපළ පිරියත සහ උපකරණ වල ශුද්ධ අගය රු. මිලියන 153.3 කි. මෙම වසර තුල ගොඩනැඟිලි නවීකරණය කිරීම, ලී බඩු සහ උපකරණ, පිරියත සහ යන්ත්‍රෝපකරණ, රසායනාගාර උපකරණ සඳහා රු. මිලියන 39 ක් ආයෝජනය කර ඇත. භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මගින් ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් රු. මිලියන 25 ක් ලැබුණු අතර එය ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අත්තිකාරම් වශයෙන් රු. මිලියන 5 ක් ද අනෙකුත් ප්‍රාග්ධන වත්කම් සඳහා රු. මිලියන 20 ක් ද වශයෙන් ලැබී තිබුණි.

ජංගම වත්කම් රු. මිලියන 249.41 සිට රු. මිලියන 340.47 දක්වා වැඩිවී ඇත. ද්‍රවශීලත්ව අනුපාතය (ජංගම වත්කම් ÷ ජංගම බැරකම්) 25 වාරයක් වූ අතර පසුගිය වසර හා සැසඳීමේදි එය 19 වාරයකි.

- ආයතනයේ සෑම අංශයකින්ම මෙම වසරේ ආදායම 18% කින් රු. මිලියන 170 සිට 202 දක්වා වැඩි වී ඇත.
- මුළු වියදම 9% කින් රු. මිලියන 153 සිට 167 දක්වා වැඩි වී ඇත.
- මුළු මෙහෙයුම් ආදායම 118% කින් වැඩි වී ඇති අතර මුළු අතිරික්තය 42% කින් වැඩි වී ඇත.

# 2017 වසරේ ක්‍රියාකාරකම්

ගුරුවරුන් පුහුණුකිරීමේ වැඩසටහන - 2017/08/31

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය සහ
ශ්‍රී ලංකා යුද්ධ උපකරණ කර්මාන්තශාලාව, දොඹගොඩ අතර
සහයෝගිතා ගිවිසුමකට ඇතුලත්වීම - 2017/05/02

## ස්ලිටා වාර්ෂික විනෝද චාරිකාව සහ සුහද හමුව 2017

## සේවක පුහුණුව උතුරු කොරියාව

## ස්ථාවර ශ්‍රී ලංකාවක් (තිරසාර ලංකා) බීඑම්අයිසීඑච්

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය සහ
ලව්ලි වෘත්තිමය විශ්ව විද්‍යාලය - පන්ජාබ්, ඉන්දියාව අතර
අවබෝධතා ගිවිසුමකට එළඹීම - රත්මලානේදී - 2017/02/03

බංගලාදේශ උසස් කොමසාරිස් කණ්ඩායම - 2017/12/11

ඉතියෝපියා කණ්ඩායම - 2017/12/11

**චින කණ්ඩායම පැමිණීම**

## 2018 වසර සඳහා අනාගත සැලසුම්

1. සෑම ඩිප්ලෝමා සහ සහතිකපත් පාඨමාලාවන් සඳහා NVQ තත්වය ලබාගැනීම.

2. උපාධි පිරිනැමීම සඳහා උපාධි තත්වය ලබාගැනීමට කටයුතු කිරීම.

3. ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණුකිරීමේ අරමුණින් යෝජිත සහමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කිරීම.

4. උපාධිධාරී මට්ටමේ දේශන පැවැත්වීම සඳහා ආයතනයේ සේවක මහත්ම මහත්මීන්ගේ සුදුසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.

5. රෙදිපිළි නිශ්පාදනයට සුදුසුවන පරිදි කෙසෙල් කෙඳි සංවර්ධනය කිරීම.

6. දකුණු ආසියානු කලාපයේ පේෂකර්ම සහ ඇඟලුම් අංශයේ සේවය පුලුල් කිරීම සඳහා සම්බන්ධීකාරකයා වශයෙන් ස්ලිටා ආයතනය කටයුතු කිරීම.

7. දේශීය ළමා ඇඳුම් සහ රෙදිපිළි ආශ්‍රිත නිශ්පාදන ආනයනයේදී ඉල්ලුම් කරන සෞඛ්‍ය සහ ආරක්ෂණ පරීක්ෂණ හඳුන්වාදීම.

8. ගෘහාශ්‍රිත කර්මාන්ත ව්‍යවසායකයින් පදනම් කරගෙන ඔවුන් අතරේ ලෙදර් සහ පාවහන් ආශ්‍රිත පුහුණු කිරීම් ජනප්‍රිය කිරීම සහ මහන මැෂින් කාර්මික පුහුණු පාඨමාලාව ග්‍රාමීය තරුණයින්හට හඳුන්වාදීම.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/බී/එස්එල්අයිටීජ්/1/17/43

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් /15 දින

TEXTILE
19 OCT 2018
RECEIVED

සභාපති,

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය.

**ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 14(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 අගෝස්තු 28 දින ආයතනයේ සභාපති වෙත නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණය කළ මතය සඳහා පදනම

--------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07**

ප්‍රමිතියේ 65 වන වගන්තිය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 201,323,461 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තු ගත දෝශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිසංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 02**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අඩමාන ණය වෙන් කිරීම් රු.230,828 ක් මෙහෙයුම් ආදායමෙන් ඉවත්කර ණයගැතියන්ට ගලපා නොතිබුණි.

(ii) වර්ෂයට අදාල රු. 21,478,709 ක පොළී ආදායම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අඩුකොට දක්වා නොතිබුණු අතර, මුදලින් ලැබුනු පොළී ආදායම රු. 15,688,119 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(iii) නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 30,000,000 ක මුදල, මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ගලා ඒම් ලෙස දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය වෙනුවෙන් 2017 වර්ෂයේදී ගෙවන ලද බාහිර දේශක ගාස්තු රු. 80,400 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී විකුණන ලද ස්ථාවර වත්කම් වලට අදාල වත්කම්වල පිරිවැය හා ක්ෂය වෙන්කිරීම් අදාල ගිණුම් වලින් ඉවත් කිරීමෙන් තොරව එම වත්කම් විකිණීමෙන් ලද රු. 153,950 ක් විවිධ ණයහිමියන් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී විකුණන ලද වාහන 05ට අදාල රු. 3,871,448 ක් වූ විකුණුම් ලාභය විවිධ ණයහිමියන්ට බැර කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදීද එම ලාභය ණයහිමි ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳණයගැති ශේෂය රු. 14,353,062 කින් රු.3,739,162 ක් එනම් සියයට 26 ක් වසර 04 ඉක්ම වූ ශේෂයන්ගෙන් සමන්විත විය.

(ආ) 2011 වර්ෂයේ ආයතනය පිහිටුවීමේ සිට මේ දක්වාම ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම් වල ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු. 290,441 ක් වූ එකතු කළ අගය මත බදු වට්නාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටද කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත<br>8 උපවගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 13 | ගිවිසුම් වටිනාකම රු.8,024,885 ක් වූ භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදු කිරීම හා රු. 17,601,850ක් වූ රසායනාගාර උපකරණ මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පොදු කොන්ත්‍රාත් පනත යටතේ ගිවිසුම් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2015 ජූලි 14 දිනැති හා අංක 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) | තත්කාර්යය සඳහා ලබා ගන්නා ලද අත්තිකාරම්, එකී අදාල කාර්ය නිමකල වහාම නිරවුල් කල යුතු වුවද අවස්ථා 22 කදී ලබාගත් රු.556,720 වූ අත්තිකාරම් දින 11 සිට දින 34ක් දක්වා ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. |
| (ඇ) සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්යය අතුරු අග්‍රිමයන් ලබා දිය හැකි උපරිම වටිනාකම රු. 100,000 ක් වුවත් එය ඉක්මවා රු.200,000 ක් හා රු. 283, 300 ක් බැගින් අවස්ථා 02ක දී අත්තිකාරම් ලබා දී තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථා, මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයන් සම්බන්ධයෙන් කෙරෙන සියලුම දීමනා සඳහා අදාල අමාත්‍යංශයේ ලේකම්ගේ අනුමැතිය මත මහා භාණ්ඩාගාරයේ හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ අනුමැතිය ලබා ගත යුතු වුවද ආයතනයේ පාලන අධිකාරිය විසින් විවිධ දීමනා ලෙස ආයතනයේ අරමුදලින් 2016 වර්ෂයේදී හා 2017 වර්ෂයේ දී ගෙවන ලද පිළිවෙලින් රු. 1,574,691 ක් හා රු.1,602,540 ක් සම්බන්ධයෙන් අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.54,535,545 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.38,418,981 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 16,116,564ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම රු. 13,804,478කින් වැඩිවී තිබුණද, පොලී ආදායම රු. 7,666,425 කින් සහ පුහුණු කිරීම් ආදායම රු.22,906,953 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මූල්‍ය අතිරික්තයක් ඇතිවී තිබුනද 2015 වර්ෂයේදී අතිරික්තයේ අඩුවීමක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික,රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.115,076,875ක් වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේදී රු.137,931,510 දක්වා වර්ධනය වී තිබුනද 2015 වර්ෂයේදී රු.111,088,905 ක් දක්වා පහත වැටී තිබුණි. ඉන් පසුව 2016 වර්ෂයේදී රු. 142,154,257ක් දක්වාද, 2017 වර්ෂයේදී රු. 161,410,561 දක්වා වර්ධනය වී තිබුනි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවලින් 2 : 1 හා 1.: 1 ක් විය යුතු වුවත් ආයතනයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය 2015 වර්ෂයේ 2 : 1 ක් වුවද 2016 වර්ෂයේ 19 : 1 ක් හා 2017 වර්ෂයේ 25 : 1 ක් ලෙස වර්ධනය වී තිබුණි. කළමනාකරණය විසින් අතිරික්ත අරමුදල් ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකරගැනීම සඳහා ඵලදායී ලෙස උපයෝජනය කරනු වෙනුවට සමාලෝචිත වර්ෂය අවසානයට රු. 154,169,439 ක් කෙටි කාලීන තැන්පත් වල ආයෝජනය කිරීම මෙයට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඩී- 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව සංශෝධිත අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවද ආයතනය විසින් එසේ කර නොතිබුණි.

(ආ) සංශෝධිත අයවැය ලේඛනයට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට ආයතනය ක්‍රියාකර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා 215 ක් පැවැත්වීම සඳහා සිසුන් 3182 ක සහභාගිවීමක් අපේක්ෂා කල ද, වර්ෂය අවසන් වන විට පාඨමාලා 201 ක් පමණක් පවත්වා, ඒ සඳහා සිසුන්ගේ සහභාගීත්වය 3463 ක් විය. එනම් අපේක්ෂිත පාඨමාලා ප්‍රමාණයට වඩා සත්‍ය ප්‍රමාණය සියයට 6.51 කින් අඩුවී තිබුණු අතර ඒ සඳහා සහභාගිවූ සිසුන් ප්‍රමාණය සියයට 8.83 කින් වැඩිවීමකි. ඒ අනුව ආයතනය විසින් පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන පාඨමාලා පිළිබඳ සැලසුම් සකස් කිරීමේදී සහ සහභාගීත්වය අපේක්ෂා කරනු ලබන සිසුන් සම්බන්ධ තීරණය කිරීමේ දී නිසි පදනමකින් සැලසුම් සකස් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ඉංජිනේරු අංශයේ පාඨමාලා 44 ක් පැවැත්වීම සඳහා සිසුන් 773ක සහභාගිවීමක් අපේක්ෂා කල ද, වර්ෂය අවසන් වන විට සිසුන් 302 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පාඨමාලා 21 ක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) බාහිර පුද්ගලයන්ගේ හා ආයතන වල ඉල්ලීම මත පවත්වනු ලැබූ පාඨමාලා හැර ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කරන ලද පාඨමාලා 146 ක් අතරින් සියයට 13 ක් එනම් පාඨමාලා 19 ක් පමණක් පවත්වා තිබුණි.

(ඈ) 2016 වර්ෂයේදී කුඩා පරිමාණයේ ඇඟලුම් කර්මාන්ත ශාලා 150ක් ඇතිකිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ පාඨමාලා පැවැත්වීම අරමුණු කර ඇති අතර පුහුණු පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් ආයතනයට රේඛීය අමාත්‍යාංශයෙන් වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 06 කි. ඉන් 2016 වර්ෂයේදී රු.1,796,346 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු. 4,325,138 ක් වශයෙන් එකතුව රු. 6,121,484 ක් වැය කර තිබුනද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පුහුණුව ලබා දිය යුතු පුහුණුලාභීන් 150 න් මන්නාරම පුහුණුලාභීන් 15 ක් සඳහා පුහුණුව ලබා දී නොතිබුණි.

(ඉ) නව රැකියා අවස්ථා උත්පාදනය තුළින් පුද්ගලයන්ගේ ජීවන තත්වය නඟා සිටුවීම, කාන්තාවන් සවිබල ගැන්වීම, සමාජ සංවර්ධනය යන අරමුණු ඉටුකර ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා එක්ව ක්‍රියාත්මක කර තිබූ ගෘහ ආශ්‍රිත ඇඟළුම් කර්මාන්ත ව්‍යාපෘතියේ යෝජනාවක් ලෙස පුහුණුලාභීන්ගේ නිෂ්පාදන වෙළඳපල වෙත ප්‍රවේශ කිරීම සඳහා උපදේශන සේවා ලබාදීම දැක්වුවද එම කාර්යය ඉටුකරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මහන මැෂින් 2040ක් හා "ඔවර් ලොක්" මැෂින් 41 ක් වෙනුවෙන් රු. 103,598,120 ක් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වන විට වැය කර තිබුණද, මෙම පුහුණු ප්‍රතිලාභීන් අදාල කර්මාන්තයේ යෙදෙන බව හා එහිදී ඇති වී තිබෙන ගැටළු පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඊ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ දිවියට උදානය ජාතික වැඩසටහනේ පුහුණු වැඩ පටහන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ආයතනය වෙත පවරා දී තිබුණු නමුත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාලව වැඩසටහන් විස්තරය, කාල රාමුව, පුහුණු කලයුතු පුහුණු ලාභීන් ගණන, ලබාදෙන ලද සේවාව වෙනුවෙන් අයකරගතයුතු ගාස්තු පිළිබඳ දෙපාර්ශවය විසින් ව්‍යාපෘතිය ආරම්භයේදී ගිවිසුමකට එළඹ නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු. 202,882,320 ක් වූ මුළු මෙහෙයුම් ආදායම තුල ඇතුලත් "පාලමුනෙයි" නූල් වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයේ විකුණුම් ආදායම රු. 978,535 ක් වුවද මෙම මධ්‍යස්ථානයේ වර්ෂයේ අමුද්‍රව්‍ය භාවිතය රු. 2,149,636 ක් වීම හේතුවෙන් රු. 2,641,544 ක ශුද්ධ පාඩුවක් වී තිබුණි. ඉකුත් වර්ෂයේදී රේෂකර්ම දෙපාර්තමේන්තුවෙන් ලද ඇණවුමකට අනුව සායම් කරන ලද නූල් ප්‍රමිතියෙන් තොර වීම හේතුවෙන්, එම නූල් නැවත වර්ණ ගැන්වීමට සිදුවීම මෙම අලාභයට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ බඳවා ගැනීම් පරිපාටියේ කණිෂ්ඨ කළමනාකරණ කොටසේ 4.4.4 ඡේදය අනුව වසරකට එක් වතාවක් හෝ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්විය යුතු වුවද, බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කල 2015 මාර්තු 23 දින සිට වාර්තාවේ දින දක්වා සේවකයින්ගේ තනතුරු වලට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ තාක්ෂණඥ (සම්භාණ්ඩ)තනතුරේ සේවය කල නිලධාරියා ශ්‍රී ලංකා යුධ හමුදාවේ ස්වේච්ඡා බලකායේ සේවය සඳහා 2018 මාර්තු 05 දින සිට මුදාහැර තිබුණු අතර එම අවස්ථාව වන විට "තාක්ෂණ හුවමාරු හා තත්ව ප්‍රවර්ධන වැඩසටහන 2017 " යටතේ වැඩසටහන් 05ක් කෙරීගෙන යන තත්වයේ පැවතුණි. එම තනතුර පුරප්පාඩුවීම හේතුවෙන් මෙම වැඩසටහන් වල ප්‍රායෝගික පුහුණුව ඇන හිට තිබුණු අතර විගණිත දින වන 2018 අප්‍රේල් 27 දින විටත් එම අංශය වසා තබා තිබුණි. ඒ හේතුවෙන් ආයතනය තුල පාවහන් හා සම් භාණ්ඩ සම්බන්ධව පුහුණු වන්නන්ගේ පුහුණු කටයුතු අඩාල වී තිබුණි.

(ඇ) ආයතනය විසින් වත්කම් ප්‍රත්‍යාගණන කාර්යය කරවා ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව වෙත රු. 822,480 ක මුදලක් ගෙවා තිබුණද, නිවැරදි ප්‍රත්‍යාගණන වාර්තා ලබාගෙන ඒවායේ සාධාරණ අගයන් ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 අනාර්ථික ගණුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාවහන් හා සම් භාණ්ඩ අංශය සඳහා 2014 වර්ෂයේදී මිලදී ගන්නා ලද පිරිවැය රු.1,385,200 ක් වූ ලී මේස 22ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්ය ලෙස ඉඩකඩ ඇහිරෙන ආකාරයට ප්‍රායෝගික පුහුණු අංශයේ තබා තිබුණු බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ආයතනයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පැරණි ගොඩනැගිල්ලේ කොටසක් කඩා ඉවත් කිරීමට සිදුවන බැවින් එම කාර්යාල කටයුතු සිදු කිරීම

වෙනුවෙන් කුලී පදනම මත මාසික වාරිකය රු. 80,000 ක් වූ ගොඩනැගිල්ලක් 2017 ජූනි 01 සිට ලබා ගෙන තිබුණි. විගණිත දිනය වන 2018 අප්‍රේල් 27 දින වන විටත් නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර මේ හේතුවෙන් කුලී පදනම මත ලබාගන්නා ලද ගොඩනැගිල්ල භාවිතයට නොගෙන වසා දමා තිබුණි. දින කිහිපයකට පමණක් පුහුණු ශිෂ්‍යයින් කිහිපදෙනෙකුට එම ගොඩනැගිල්ලේ නවාතැන් ලබා දී තිබුණි. එම කුලී ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය 2018 අප්‍රේල් 16 දින සිට අවලංගු කර තිබුනද මාස 10 ක් සඳහා කුලී වශයෙන් රු. 800,000 ක් ගෙවා තිබුණි.

දෙපාර්ශවය අතර ඇතිකර ගෙන තිබූ ගිවිසුමේ 3(F) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගිවිසුම අවලංගු කරන්නේ නම් මාස 03 කට පෙර ඒ බව අනෙක් පාර්ශවය වෙත දැනුම් දිය යුතු වුවද ආයතනය විසින් ගිවිසුම අවලංගු කරන බව දැනුම් දී ඇත්තේ 2018 මාර්තු 09 දින එනම් දින 38 කට පෙර වේ. මේ හේතුවෙන් ආයතනය විසින් ගෙවා තිබූ රු. 240,000 ක අත්තිකාරම් මුදලින් නැවත 2018 අගෝස්තු 06 දින ආයතනය වෙත ලැබී තිබුණේ රු. 80,000ක් පමණක් වන අතර ආයතනයට රු. 160,000ක පාඩුවක් සිදුවී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 140 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 98 ක් වූයෙන් පුරප්පාඩු 42ක් පැවතුණි. වසර දෙකකට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවති මෙම තනතුරු පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ කාර්ය මණ්ඩලය තුල ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටමේ නිලධාරීන් 82 ක පිරිසක් සේවයේ නියුක්තව සිටින අතර අනුමත වැඩ සහායකවරු සංඛ්‍යාව 13 ක් වුවද තථ්‍ය වශයෙන් සේවයේ නියුක්තව සිටිනු ලබන්නේ එක් අයෙකු පමණි.

(ඇ) බඳවා ගැනීම් පරිපාටියේ 5.3 ඡේදය අනුව ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම් පත් කැඳවීමක් සිදු කිරීමෙන් තොරව සහකාර ඉංජිනේරු (තොරතුරු තාක්ෂණ) තනතුර සඳහා නිලධාරියෙකු බඳවා තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබූ නමුත් වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි.

### 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2016 වසරේ විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති පහත සඳහන් කරුණු වලට අදාලව කටයුතු කර නොතිබුණි.

(අ) වසර 2009 දී ආරම්භ කරන ලද ආයතනය ස්ථාපිත කොට වසර 08 ක් ඉක්මගොස් තිබුණද, 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 01 කොටසේ 04 (අ) ඡේදය ප්‍රකාරව පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය පිළිබඳව පශ්චාත් උපාධි සහ උපාධි වැඩසටහන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතිවලට සහ සමාගම් ප්‍රමිති පද්ධතිවලට අනුකූලව පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන්ට අනුකූලතා සහතික නිකුත් කිරීම, ආයතනයේ පරමාර්ථයක් වුවද, ආයතනය මඟින් පවත්වාගෙන යන "වැඩ අධ්‍යනය" පාඨමාලාව හැර අනෙකුත් පාඨමාලා සඳහා ජාතික වෘත්තිය මට්ටමේ සුදුසුකම් තත්ත්වය(NVQ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ලබා ගෙන නොතිබුණි.

(ඇ) ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ ජීප් රථයක් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් 2014 වර්ෂයේ නොවැම්බර් මස තාවකාලික පදනමට ලබාගෙන ඒ සඳහා අලුත්වැඩියා වියදම් ලෙස රු.362,175 ක් වැය කර තිබුණි. නමුත් මෙම වාහනය ධාවනය කලහැකි තත්ත්වයට පත් වී නොතිබුණු බැවින් නැවත අමාත්‍යාංශය

වෙත භාර දී තිබූ අතර අලුත්වැඩියාව සඳහා වැය කරන ලද මුදල කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු කැබ් රථය රේගිය අමාත්‍යංශයේ භාවිතය සඳහා 2013 සැප්තැම්බර් 04 දින නිදහස් කර තිබිය දී එම වාහනයේ අලුත්වැඩියා වියදම් ලෙස එකතුව රු.910,472 ක් ආයතනය විසින් දරා තිබුණ නමුත් එම මුදල, අමාත්‍යංශය වෙතින් ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකි වී තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.1.1 ප්‍රසම්පාදනයන්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ), (ඇ) හා (ඉ) ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කොට ඊළග එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු බව හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට නොවැඩි කාලයක් තුල යාවත්කාලීන කල යුතු වුවද ආයතනය විසින් පිලියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම එම අවශ්‍යතාවයන් හා අනුකූල වී නොතිබුණි.

(ආ) ආරක්ෂක සේවාව , පවිත්‍රතා සේවය හා ආයතන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම යන සේවාවන් සඳහා ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගී වන සියලුම ලංසුකරුවන් විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 විධිවිධාන පරිදි නියමිත ආකෘති පත්‍ර අනුව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. තවද ඒ සම්බන්ධව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කිසිදු අයුරකින් ලංසුකරුවන් දැනුවත් කිරිමක්ද කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශ ප්‍රකාර ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් 10 % කට නොඅඩු යෝග්‍ය මුදල්මය සුරක්ෂණ මගින්

වගකීම් පිළිබඳ බැඳීම් ආවරණය කර ගත යුතු වුවද 2017/2018 ආරක්ෂක සේවා වියදම් රු. 2,142,000 ක් හා පවිත්‍රතා වියදම රු. 3,360,000 ක් සම්බන්ධයෙන් කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි.

**6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** ආයතනයේ භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදු කිරීම සඳහා 2017 ඔක්තෝබර් 14 දින ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය යටතේ ලංසු කැඳවීම් සිදුකර තිබුණි. ලංසු කරුවන් 03 දෙනෙකුගෙන් ලංසු ඉදිරිපත් වී තිබූ අතර ඒ අතරින් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන සංග්‍රහය 6.2.2 විධිවිධාන ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 21 ක් වුවද, මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් ලංසු කැඳවීමට ලබා දී තිබුණේ දින 12 ක් පමණි.

(ii) රජයේ ප්‍රසම්පාදන සංග්‍රහය 7.3.1.(ආ) විධිවිධාන ප්‍රකාරව උපදේශකයන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සමාජිකයන් නොවිය යුතු වුවද අදාල ප්‍රසම්පාදන වෙනුවෙන් පත් කරන ලද උපදේශකයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවේද සමාජිකයෙකු වී තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 18 විධිවිධාන ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීම සඳහා නියමිත කාල සීමාව දීර්ඝ කිරීමකදී සුරක්ෂණයෙහි තහවුරු කර ඇති වලංගු දින ඉකුත් වීමට පෙර සුරක්ෂණයන් දීර්ඝ කරගත යුතු වුවත් ඉහත කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 2018 මාර්තු 06 දින වන විට රු. 1,882,638ක් වූ අත්තිකාරම් සුරක්ෂණයේ සහ 2018 මාර්තු 07 දින වන විට රු.802,488 ක් වූ කාර්ය සාධන සුරක්ෂණයේ වලංගු කාලසීමාව අවසන් වී තිබුණි. සුරක්ෂණය මත කොන්ත්‍රාත්කරුට රු. 1,882,638 ක සචලීකරණ අත්තිකාරම් මුදලක්ද 2018 ජනවාරි 03 දින ලබා දී තිබුණද 2018 ජුනි 30 දින වන විටත් ආයතනය විසින් භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදුකිරීම ආරම්භ කර නොතිබුණි.

(ඇ) පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයට අදාල පාඨමාලා සහ පශ්චාත් උපාධි සහ උපාධි වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය මූලික පහසුකම් සපයා ගැනීමේ අරමුණින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2015 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා රු. මිලියන 23ක් භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණි. ඉන් රු. 1,586,831ක් ප්‍රධාන සැලැස්ම හා පස් සාම්පල් පරීක්ෂාව සඳහා පමණක් 2018 මැයි 31 වන විට වැය කර තිබුණු අතර ඉදිකිරීම් කටයුතු 2018 ජූලි 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. ඉතිරි රු. 21,413,619 මුදල ආයතනයේ කෙටිකාලීන තැන්පත් වල ආයෝජනය කර තිබුණි.

## 6.2 අයවැය පාලනය

අයවැයගත ආදායම හා වියදම සහ තථ්‍ය ආදායම් හා වියදම අතර සියයට 10 සිට සියයට 310 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 7 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන | නිරීක්ෂණ |
|---|---|
| (අ) ණයගැතියෝ | ණයගැති ශේෂ විධිමත් පරිදි අයකර ගැනීමේ වැඩපිළිවෙලක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) පාඨමාලා පැවැත්වීම | විභාග කටයුතු අපක්ෂපාතීව සහ ක්‍රමවත්ව සිදු කිරීම සඳහා විභාග අංශයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඇ) ප්‍රසම්පාදන කටයුතු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති